

වාර්ෂික වාර්තාව

2020

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව මඟින් අධ්‍යයන කටයුතු සහ ජයග්‍රහණ සම්බන්ධව ආයතනික දළ විශ්ලේෂණයෙහි සවිස්තරාත්මක සාරාංශයක් සපයයි. මෙහි අඩංගු තොරතුරු අදාල පීඨ/ දෙපාර්තමේන්තු/ අංශ/ ඒකක මගින් සපයන ලද අතර තොරතුරු හා සංඛ්‍යාන ඒකකය මඟින් සම්පාදනය කරන ලදී.

දැක්ම

විද්‍යාව, තාක්ෂණය, සහ මානව ශාස්ත්‍රය පිළිබඳ උසස් අධ්‍යයනය සහ නවෝත්පාදන සඳහා වූ දකුණු ආසියාවේ ජාත්‍යන්තරව පිළිගත් කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

මෙහෙවර

කලාපීය සහ ජාතික අවශ්‍යතාවයන්, සාමාජීය සහයෝගීතාවය සහ සමාජ සමූහයන් සවිබල ගැන්වීම සහ තෘප්තිමත් කිරීම ඉලක්ක කර ගනිමින්, දැනුම සහ නව නිපැයුම් උත්පාදනය කිරීම හා බෙදා හැරීම තුලින්, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ උසස් අධ්‍යාපනය සඳහා පුළුල් අවස්ථාවන් සලසාදීම.

අරමුණු

1. අධ්‍යයන ගුණාත්මකභාවය පිළිබඳ විශිෂ්ඨත්වය.

2. පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම ව්‍යාප්ත කිරීමේ විශිෂ්ඨත්වය.

3. සමාජ හා කාර්මික අපේක්ෂාවන් ආමන්ත්‍රණය කිරීමේ විශිෂ්ඨත්වය.

4. යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනයෙහි විශිෂ්ඨත්වය.

5. ජාතික හා ජාත්‍යන්තර සහයෝගීතාවයේ විශිෂ්ඨත්වය.

6. යහ පාලනය සහ තිරසාර භාවය පිළිබඳ විශිෂ්ඨත්වය.

උපකුලපතිවරයාගේ පණිවුඩය



මහාචාර්ය එම්.එම්.එම්.නාජිම්

සිසුන්ගේ, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජයග්‍රහණයන් පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සමස්ත ජයග්‍රහණයන් 2020 වාර්ෂික වාර්තාව තුලින් ඉස්මතු කරනු ලබයි. 2019-2024 දක්වා ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාලයේ උපාය මාර්ගික සැලැස්මෙහි දක්වා ඇති ඉලක්ක වලට සමාන්තරව සමාජ, සංස්කෘතික, කලාපීය හා ජාතික සංවර්ධනයේදී විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ලද දායකත්වයන් වාර්තාව ඉස්මතු කරයි. ඊට අමතරව, විශ්වවිද්‍යාලය මුහුණ දෙන අභියෝග සහ අඩුපාඩු, සාධාරණ හේතු සහිතව අවධාරණය කෙරේ.

“සෞභාග්‍යයේ දැක්ම” හා බැඳුණු රජයේ ප්‍රතිපත්ති විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරමින් සිටී. තවද, භාණ්ඩාගාර අරමුදල් සහ AHEAD අරමුදල් වල සහයෝගයෙන් සිසුන් සඳහා සපයන සේවාවන්හි කාර්යසාධනය සහ ගුණාත්මකභාවය ශක්තිමත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් සිසුන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සඳහා කුඩා ඉදිකිරීම් කටයුතු කිහිපයක්ම ක්‍රියාත්මක කරන ලද අතර එමඟින් සිසුන්ට කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම්වල නියැලීමට අවකාශයක් ලැබෙනු ඇත. තාක්ෂණ පීඨයේ අලුතින් ඉදිකරන ලද ගොඩනැගිල්ල සහ බහුකාර්ය ශ්‍රවණාගාරය විශේෂයෙන් සිසුන්ගේ සහ පොදුවේ විශ්වවිද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා උපයෝගී කර ගෙන ඇත. Scopes, Scimago, Clarivate Analytics දත්ත ගබඩා ආදී සුප්‍රසිද්ධ දත්ත පද්ධතීන් තුල සුවිගත කර ඇති, සුවිගත කරන ලද සඟරා පත්‍රිකා ප්‍රකාශනයන් සංඛ්‍යාව තවදුරටත් ඉහල නංවා ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය කැපීපෙනෙන ලෙස දායක විය. තවද, සුදුසුකම් සහිත අධ්‍යයන හා වෙනත් කාර්ය මණ්ඩලය සම්බන්ධ වීමත් සමඟ විශ්වවිද්‍යාලයේ මානව ප්‍රාග්ධනය ශක්තිමත් විය. ඊට

සමගාමීව, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකු මහාචාර්යවරුන් ලෙස උසස් වීම තුලින් විශ්වවිද්‍යාලයේ සේවාවන් සැපයීමේ ධාරිතාව තවදුරටත් ඉහළ නැංවී ඇත.

විශ්වවිද්‍යාලයේ ජයග්‍රහණ පිළිබඳව වැඩිදුර දැන ගැනීම සඳහා පරිශීලනය කළ හැකි, 2020 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය ඉමහත් සතුටින් ඉදිරිපත් කරනු ලබයි. 2020 වර්ෂයේදී ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා වෙහෙස මහන්සි වී වැඩ කළ සියළුම දෙනාට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

මහාචාර්ය එම්.එම්.එම්.නාජිම්
උපකුලපති
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

පටුන

අනු අංකය	ශීර්ෂය	පිටු අංකය
	දැක්ම	
	මෙහෙවර	
	අරමුණු	
	උපකුලපතිවරයාගේ පණිවුඩය	
1.	විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය	01
	කෙටි හැඳින්වීම	01
	සංවිධාන සටහන	02
	විශ්වවිද්‍යාල මන්ත්‍රණ/පාලක සභාව	03
	විශ්වවිද්‍යාල සනාතන සභාව	05
	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පවතින අධ්‍යයන වැඩසටහන්	09
	පශ්චාත් උපාධි අධ්‍යයන	12
	ආරම්භ කිරීමට නියමිත නව අධ්‍යයන වැඩසටහන්	13
	ලෝක ශ්‍රේණිගත කිරීම්	14
	ශිෂ්‍ය ප්‍රජාව	15
	සේවක ප්‍රජාව	15
	අධ්‍යයන කාර්යමණ්ඩලයේ විහිදීම	16
	තිරසාර සංවර්ධනය	17
	පරිසරය සුරැකීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග	21
	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය පුස්තකාල	23
	ජයග්‍රහණ සහ පිළිගැනීම්	25
	අසාර්ථකවීම් සහ ඊට හේතු	31
	අනාගත සැලසුම්	32
2.	සිසුන් සහ සම්පත් පිළිබඳ විස්තර	34
3.	දේශීය සිසුන් පිළිබඳ විස්තර	35
4.	විදේශීය සිසුන් පිළිබඳ විස්තර	40
5.	උපාධිධාරීන් බිහි කිරීම	41
6.	කාර්ය මණ්ඩල විස්තර	44
7.	අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	45
8.	අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	46
9.	උපාධිධාරීන්ගේ සේවා නියුක්ති හැකියාව	47
10.	පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර	49
11.	2020 වර්ෂය තුල මහජනතාවට දැනුම් බෙදාහැරීම් පිළිබඳ විස්තර	74
12.	ලැබූ සම්මාන පිළිබඳ විස්තර	75
13.	**2020** වර්ෂයේදී අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් ලද විදේශීය අධි සාමාජිකත්ව, ශිෂ්‍යත්ව/සම්මාන පිළිබඳ තොරතුරු (සම්මන්ත්‍රණ/ වැඩමුළු/ කාර්ය මණ්ඩල සංවර්ධනය/ පුහුණු/ කෙටි පාඨමාලා)	76
14.	පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය (2020 දී දේශීය හා විදේශීය)	78

15.	2020 වර්ෂයේදී අදාල පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කරන ලද අධ්‍යයන, අධ්‍යයන සහායක සහ පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	78
16.	වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර	79
17.	ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර	83
18.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර	83
18.1	ආදායම	83
18.2	ප්‍රධාන වැඩසටහන් වල පුනරාවර්තන වියදම	83
18.3	ප්‍රාග්ධන වියදම්	84
18.4	වියදම්	84
19.	මූල්‍ය කාර්ය සාධනය විශ්ලේෂණය -2020	84
19.1	සිසුවෙකුට පිරිවැය (පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම)	84
20.	වාර්ෂික ගිණුම් - 2020	85
21.	විගණකාධිපතිගේ වාර්තාව 2020	103
22.	විගණකාධිපතිගේ වාර්තාව සඳහා නිරීක්ෂණ	111

1. විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

කෙටි හැඳින්වීම

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය 1995 වසරේ දී ස්ථාපිත කර ඇත. ප්‍රධාන විශ්වවිද්‍යාලය ඔලුවිල් හි වෙරළබඩ තීරයේ ස්ථාපිත කර අති අතර එය අක්කර 178.98 ක පමණ (2011 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව) තෘණ භූමි භාගයක ව්‍යාප්තව ඇත. විශ්වවිද්‍යාලයේ (ඔලුවිල් පරිශ්‍රයේ) නැගෙනහිර කොටසේ පවතින අඛණ්ඩ මුහුදු බාදනය හේතුවෙන් භූමි ප්‍රමාණයෙන් අක්කර 25.45 ක ප්‍රමාණයක් මේ වන විට විශ්වවිද්‍යාලයට අහිමි වී ඇත. ව්‍යාවහාරික විද්‍යා පීඨය අක්කර 6.72 ක භූමිභාගයක සමන්තුරේ පිහිටා ඇත (2011 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව). තාක්ෂණික පීඨය යටතේ වූ මල්වත්ත ගොවිපළ (2011 තක්සේරු කිරීම් අනුව,අක්කර 35.25) කෘෂි තාක්ෂණය සඳහා වූ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා යොදා ගනු ලබයි. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල ප්‍රගතියක් විශ්වවිද්‍යාලය විසින් වාර්තා කර ඇත.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සහ විදේශීය රැකියා අවස්ථා සඳහා සරිලන ලෙස උපාධිධාරීන් බිහිකිරීම අරමුණුකොට ගෙන ඊට ගැළපෙන පරිදි උත්කෘෂ්ඨවත් අධ්‍යයන මට්ටමක් පවත්වාගෙන යාමට කටයුතු කරන විශ්වවිද්‍යාලයකි. එසේම සමස්ථ ප්‍රජාවට සහ ඇල්මක් දක්වන පාර්ශ්ව සඳහා අවශ්‍යතාවයට අනුකූල වන පරිදි පහසුකම් සපයමින් බහුවිධ පර්යේෂණ සංස්කෘතියක් විශ්වවිද්‍යාලය තුල වර්ධනය කිරීමට කටයුතු කරමින් සිටියි. මීට අමතරව ප්‍රදේශයේ සාමය සහ සහජීවනය සඳහා ද විශ්වවිද්‍යාලය විශාල දායකත්වයක් සපයයි. වර්තමානයේ විශ්වවිද්‍යාලය සතුව පවතින පීඨ හය තුල මූලික උපාධි අපේක්ෂකයින් 5,558 ක්, පශ්චාත් උපාධි අපේක්ෂකයින් 405 ක් සිටියි. විශ්වවිද්‍යාලය සතුව ස්ථිර කාර්ය මණ්ඩලය 662 ක් සිටින අතර මේ තුල අධ්‍යයන කාර්ය මණ්ඩලය 189 දෙනෙකු සිටියි.

විශ්වවිද්‍යාලයේ නාමය ජාත්‍යන්තරයේ පිළිගත් විශ්වවිද්‍යාලයක් බවට පත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය එහි විශිෂ්ඨ විද්වතුන් සමඟින් කැප වී සිටී.

සංවිධාන සටහන

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය



SSSW-ශිෂ්‍ය සහායක සේවා හා සුබසාධන
OSPIM- උපායමාර්ගික සැලසුම් සහ ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීමේ කාර්යාලය
RIC-පර්යේෂණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානය
CEDPL-බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ මධ්‍යස්ථානය
CGU-වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
SDC-කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
CGEE –ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය
UBL Cell- විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා කුටිය
MIT- කළමනාකරණ තොරතුරු තාක්ෂණ
CQA- තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය

DR-නියෝජ්‍ය ලේඛකාධිකාරී
DB-නියෝජ්‍ය මූල්‍යාධිකාරී
SAB-ජෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
SAR- ජෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
SAIA- ජෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
WE- වැඩ ඉංජිනේරු
AR- සහකාර ලේඛකාධිකාරී
AB- සහකාර මූල්‍යාධිකාරී
AIA- සහකාර අභ්‍යන්තර විගණක
CSO- ප්‍රධාන ආරක්ෂක නිළධාරී

SALB- ජෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
ALB- සහකාර පුස්තකාලයාධිපති
AS- සහකාර සංඛ්‍යාඥ

<u>විශ්වවිද්‍යාල මන්ත්‍රණ/පාලක සභාව</u>

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පාලනාධිකාරය සහ ප්‍රධාන විධායක ඒකකය වන්නේ විශ්වවිද්‍යාල පාලක සභාවයි (Council). උපකුලපතිවරයා එම තනතුරට පැවරූ අධිකාරයෙන් පාලක සභාවේ සභාපතිවරයා වේ. පීඨ මණ්ඩල වලින් සනාතන සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා අනුමැතිය ලබා දීමේ අවසාන අධිකාරිය බලය පාලක සභාව සතු වේ. මූල්‍ය කමිටුව, ඉඩම් සහ ගොඩනැගිලි නඩත්තු කමිටුව, විගණන හා කළමනාකරණ කමිටුව, ටෙන්ඩර් මණ්ඩලය සහ තේරීම් කමිටුව මෙහි උප කමිටු වේ. විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී පාලක සභාවේ ලේකම්වරයා වේ.

නිල බලයෙන් පත් වූ සාමාජිකයින්

මහාචාර්ය එම්.එම්.එම්. නාජිම්	උප කුලපති
ආචාර්ය එස්.එම්. ජුනයිඩීන්	පීඨාධිපති/ඉංජිනේරු පීඨය
ආචාර්ය එස්.එම්.එම්. මසාහිර්	පීඨාධිපති/ ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය
ආචාර්ය එස්. ගුණපාලන්	පීඨාධිපති/කළමනාකරණ හා වාණිජ පීඨය
ආචාර්ය යූ.එල්. සෙයිනුඩීන්	පීඨාධිපති/ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය ඒ.රමීස්	පීඨාධිපති/කලා හා සංස්කෘතික පීඨය
ආචාර්ය යූ.එල්.ඒ.මජීඩ්	පීඨාධිපති / තාක්ෂණ පීඨය *(2020.01.29 සිට)*
ආචාර්ය එම්.ජී.මොහමඩ් තාරික්	පීඨාධිපති / තාක්ෂණ පීඨය *(2020.01.28 දක්වා)*

සනාතන සභා නියෝජිතයින්

ආචාර්ය එම්.එච්.හාරූන් *(2020.06.24 සිට)*

ආචාර්ය එස්. සඵිනා එම්.ජී.හසන් *(2020.06.24 සිට)*

මහාචාර්ය එම්.ඒ.එම්.රමීස් *(2020.05.17 දක්වා)*

මහාචාර්ය ඒ.ජහුෆර් *(2020.05.17 දක්වා)*

පත්කල සාමාජිකයින්

අයි.එම්.හනීෆා මහතා

ආචාර්ය අන්වර් එම්.මුස්තාෆා මහතා

ඉංජි. මුහීනුදීන් අබ්දුල් කාදර්

ආචාර්ය ටී.එස්.ආර්.ටී.ආර්.රාජබ්

ඉංජි. එන්.ටී.මොහමඩ් සිරජුදීන්

එම්.සී. මොහමඩ් නවාස් මහතා

මහාචාර්ය කොලින් එන්. පීරිස්

ජේ.එම්.නලීර් මහතා

ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා

මහාචාර්ය හේමා එම්.කේ.කේ.පතිරණ මිය *(2020.10.02 සිට)*

ආචාර්ය ඒ.එම්.පී.ඩී.කේ.අධිකාරී *(2020.09.30 දක්වා)*

ලේකම්

එච්.අබ්දුල් සත්තාර් මහතා, ලේඛකාධිකාරී

<u>විශ්වවිද්‍යාල සනාතන සභාව</u>

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සම්බන්ධ අධිකාරී බලය පවතින ඒකකය වන්නේ සනාතන සභාවයි. සාර්ථක අධ්‍යයන ප්‍රතිඵලයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාවට සහ මහජනයාට වගකියන ඉගෙනීම්, ඉගැන්වීම්, පර්යේෂණ සහ විෂයමාලා හා විභාග පද්ධති සම්බන්ධ ක්‍රියාකාරකම් පීඨ, දෙපාර්තමේන්තු සහ අංශ හරහා නිර්මාණය කිරීමේ කටයුතු සම්බන්ධ මෙහෙයවීම සහ පාලනය කිරීම ඒ මගින් සිදු කෙරේ. මේ මඟින් පීඨයන් විසින් ඉදිරිපත් කරන යෝජනා අනුමත කිරීම සහ නිර්දේශ කිරීම ද ඒවා අවසාන අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල පාලක සභාව වෙත යොමු කිරීමද සිදුවේ. සනාතන සභාවේ උප කමිටු ලෙස පුස්තකාල කමිටුව, අධ්‍යයන නිවාඩු සහ ප්‍රදාන කමිටුව, බඳවා ගැනීමේ කමිටුව, පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව, විෂයමාලා සහ ඇගයීම් කමිටුව ඇතුලත් වේ. සනාතන සභාවේ ලේකම්වරයා වන්නේ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයාය.

නිළ බලයෙන් පත්වූ සාමාජිකයින්

මහාචාර්ය එම්.එම්.එම්. නාජිම්	උප කුලපති (සභාපති)
ආචාර්ය එස්.එම් ජුනයිඩීන්	පීඨාධිපති/ඉංජිනේරු පීඨය
ආචාර්ය එස්.එම්.එම් මසාහිර්	පීඨාධිපති/ ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය
ආචාර්ය එස්. ගුණපාලන්	පීඨාධිපති/කළමනාකරණ හා වාණිජ පීඨය
ආචාර්ය යූ.එල්. සෙයිනුඩීන්	පීඨාධිපති/ව්‍යවහාරික විද්‍යා පීඨය
මහාචාර්ය ඒ.රමීස්	පීඨාධිපති/කලා හා සංස්කෘතික පීඨය
ආචාර්ය යූ.එල්.ඒ.මජීඩ්	පීඨාධිපති / තාක්ෂණ පීඨය *(2020.01.29 සිට)*
ආචාර්ය එම්.ජී.මොහමඩ් තාරික්	පීඨාධිපති / තාක්ෂණ පීඨය *(2020.01.28 දක්වා)*
මහාචාර්ය එම්.ඒ.එම්.රමීස්	
මහාචාර්ය එෆ්.එච්.ඒ.රවුෆ් මහත්මිය	
මහාචාර්ය ඒ.එල්.ඒ.රවුෆ්	
මහාචාර්ය ඒ.ජහුෆර්	
මහාචාර්ය ඒ.එම්.මුසාතික්	
මහාචාර්ය එම්.බී.එම්.ඉස්මයිල්	

මහාචාර්ය ඒ.ජහුෆර්	ප්‍රධානී / ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යයනාංශය
මහාචාර්ය එම්.ඒ.එල්. අබ්දුල් හලීම්	
මහාචාර්ය එම්.අයි.එම්.කලීල්	
එම්.එම්. රිෆයුදීන් මහතා	පුස්තකාලාධිපති
ආචාර්ය එස්. සෆිනා එම්.ජී.හසන්	ප්‍රධානී / කළමනාකරණ අධ්‍යයනාංශය
ඉංජි. එම්.සී.රියාස්	ප්‍රධානී / සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය *(2020.09.14 සිට)*
ආචාර්ය ජේ. ඒ. තම්බෝ	ප්‍රධානී / සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය (*2020.09.13 දක්වා*)
ඉංජි. එම්. අයි ඉල්හාම් ජසීල්	ප්‍රධානී / අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයනය
ආචාර්ය එම්.ඒ.එස්.එෆ්.සාදියා	ප්‍රධානී / භාෂා අධ්‍යයනාංශය
ආචාර්ය ඒ.එම්.එම්.නවාස්	ප්‍රධානී / ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය
එම්.සී.එස්.ෂාතිෆා මිය	ප්‍රධානී / අරාබි භාෂා අධ්‍යයනාංශය *(2020.12.24 සිට)*
ආචාර්ය ඒ.ආර්.නසාර්	ප්‍රධානී / අරාබි භාෂා අධ්‍යයනාංශය *(2020.11.29 දක්වා)*
ආචාර්ය එම්.එම්.ෆාසිල්	ප්‍රධානී / දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය එම්.අයි.එම්.ජසීල්	ප්‍රධානී / ඉස්ලාමීය අධ්‍යයනය
ආචාර්ය එම්.එම්.මුනීබ්	ප්‍රධානී / ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය **(*2020.01.29 සිට*)**
ආචාර්ය යූ.එල්.අබ්දුල් මජීඩ්	ප්‍රධානී / ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය *(2020.01.28 දක්වා)*
ආචාර්ය එම්.එච්.හාරූන්	ප්‍රධානී /රසායන විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය ඒ.ඒ.එම්.නුෆයිල්	ප්‍රධානී / ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය
ආචාර්ය එස්.එම්.අහමඩ් ලෙබ්බේ	ප්‍රධානී / ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය *(2019.05.06 දක්වා)*
ආචාර්ය එස්. අනුසියා	ප්‍රධානී /සමාජීය විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය වී.සුජාරාජිනී මහත්මිය	ප්‍රධානී /ජෛවීය විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය එම්.අයි.එම්.හිලාල්	ප්‍රධානී /අලෙවි කළමනාකරණ අධ්‍යනාංශය
එම්.එච්.එම්.රිනෝස් මහතා	ප්‍රධානී /භූගෝල විද්‍යා අධ්‍යනාංශය

ආචාර්ය එස්.එම්.අයූබ්	ප්‍රධානී / සමාජ විද්‍යා
ඒ.එල්.හනීස් මහතා	ප්‍රධානී /ගණිතමය විද්‍යා අධ්‍යනාංශය
ආචාර්ය පී.එම්.කේ.අලහකෝන්	ප්‍රධානී /විදුලි හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යනාංශය
ආචාර්ය ඒ.එම්.එන්.එම්.අධිකාරම්	ප්‍රධානී /භෞතික විද්‍යා අධ්‍යයනාංශය
ආචාර්ය ඩබ්.ජී.සී.ඩබ්.කුමාර	ප්‍රධානී /පරිගණක විද්‍යා සහ ඉංජිනේරු අධ්‍යයනාංශය
ආචාර්ය යූ.ෆාරුක්	ප්‍රධානී / යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය
කේ. මොහමඩ් රිෆ්ති මහතා	ප්‍රධානී / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය
එස්.සබ්‍රාස් නවාස් මහතා	ප්‍රධානී / කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය

පත්කල සාමාජිකයින්

ව්‍යවහාරික විද්‍යා පීඨය

එම්.ඒ.ඒ.එම්.ෆහාම් මහතා
ආචාර්ය ඒ.එම්.රස්මි

කලා හා සංස්කෘතික පීඨය

ඒ.වික්‍රමරත්න මහතා *(2020.06.02.සිට)*
එම්.ඒ.එම්.සමීම් මහතා *(2020.09.10 සිට)*
ආචාර්ය ඒ.එෆ්.එම්. අෂ්රෆ් *(2020.03.12 දක්වා)*
මහාචාර්ය එම්.අයි.එම්.කලීල් *(2020.07.27 දක්වා)*

ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨය

ආචාර්ය ආර්.ඒ.සර්ජූන්
එම්.සී.එස්.ෂානිෆා මහත්මිය *(2020.12.23 දක්වා)*

කළමනාකරණ හා වාණිජ පීඨය

ආචාර්ය ඒ. හලීම්

ආචාර්ය එම්.සී.ඒ.නසාර්

ඉංජිනේරු පීඨය

ඉංජිනේරු ඒ.එල්.එම්.රිසාත්

ආචාර්ය ජේ.ඒ.එස්.පී.ජයකොඩි

තාක්ෂණ පීඨය

ආර්.කේ.ඒ.රිෆායි කාරියප්පර් මහතා

ආචාර්ය ඒ.එන්.එම්. මුබාරක්

ලේකම්

එච්.අබ්දුල් සත්තාර් මහතා, ලේඛකාධිකාරී

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන්

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සතුව පීඨ හයක් (06) ඇති අතර ඒවා නම් කලා සහ සංස්කෘතික පීඨය, කළමනාකරණ සහ වාණිජ පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය, ඉංජිනේරු පීඨය සහ තාක්ෂණ පීඨය යන පීඨ වේ. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් මූලික උපාධි සහ පශ්චාත් උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර සහ විවිධ පුහුණු වැඩසටහන් සිදු කරයි. දේශීය ප්‍රජාවගේ වුවමනාවන් සපුරාලීම සඳහා විශ්වවිද්‍යාලය මගින් දේශීය හා විදේශීය සංවිධාන සමඟ වැඩමුළු පවත්වමින් සහයෝගිව ක්‍රියාකරයි. අධ්‍යයනාංශ, ඒකක සහ පීඨ මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

වගුව 1.1: ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ අධ්‍යයන දෙපාර්තමේන්තු සහ ඒකක පිළිබඳ විස්තර

කලා හා සංස්කෘතික පීඨය
සමාජ විද්‍යාව
භාෂා
දේශපාලන විද්‍යාව
සමාජීය විද්‍යාව
ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය
භූගෝල විද්‍යාව
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය
පශ්චාත් උපාධි ඒකකය

කළමනාකරණ හා වාණිජ පීඨය
ගිණුම්කරණය සහ මූල්‍ය
කළමනාකරණ
කළමනාකරණ තොරතුරු තාක්ෂණය
අලෙවි කළමනාකරණය
පශ්චාත් උපාධි ඒකකය
ව්‍යවහාරික විද්‍යා පීඨය
ජීව විද්‍යාව
ගණිතමය විද්‍යාව
භෞතික විද්‍යාව
රසායන විද්‍යාව
ඉස්ලාමීය අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය
ඉස්ලාම් අධ්‍යයන
අරාබි භාෂාව
අන්තර් ක්ෂේත්‍ර පාඨමාලා ඒකකය
ඉංජිනේරු පීඨය
සිවිල් ඉංජිනේරු
යාන්ත්‍රික ඉංජිනේරු
විදුලි සහ ඉලෙක්ට්‍රෝනික් ඉංජිනේරු විද්‍යාව
පරිගණක විද්‍යාව හා ඉංජිනේරු විද්‍යාව
අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයනය
තාක්ෂණ පීඨය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ජෛව පද්ධති තාක්ෂණය

වගුව 1.2: පීඨ මඟින් ප්‍රදානය කරනු ලබන උපාධි පාඨමාලා (අභ්‍යන්තර)

මූලික උපාධි පාඨමාලා	SLQF මට්ටම	සාමාන්‍ය/ විශේෂ	කාලසීමාව	මාධ්‍ය
කලා හා සංස්කෘතික පීඨය				
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය	5	සාමාන්‍ය	වර්ෂ 3	දෙමළ
දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ	වර්ෂ 4	දෙමළ
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දෙමළ / ඉංග්‍රීසි
දර්ශන විද්‍යාව සහ මනෝ උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දෙමළ
සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දෙමළ / ඉංග්‍රීසි
භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දෙමළ / ඉංග්‍රීසි
දෙමළ පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දෙමළ
තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි
දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL) පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි
හින්දු ශිෂ්ඨාචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		දෙමළ
ත්‍රිභාෂා අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය	6	විශේෂ		ත්‍රිභාෂා
කළමනාකරණ සහ වාණිජ පීඨය				
ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ	වර්ෂ 4	දෙමළ / ඉංග්‍රීසි
වාණිජවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි
කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය	5	සාමාන්‍ය	වර්ෂ 3	
ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ	වර්ෂ 4	
මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		
අලෙවි කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		
තොරතුරු පද්ධති පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය	6	විශේෂ		

මූලික උපාධි පාඨමාලා	SLQF මට්ටම	සාමාන්‍ය/ විශේෂ	කාලසීමාව	මාධ්‍ය
ව්‍යවහාරික විද්‍යා පීඨය				
ජෛව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය	5	සාමාන්‍ය	වර්ෂ 3	ඉංග්‍රීසි
භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	5	සාමාන්‍ය	වර්ෂ 3	
ව්‍යවහාරික ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	වර්ෂ 4	
උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	වර්ෂ 4	
ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	වර්ෂ 4	
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	වර්ෂ 4	
ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	වර්ෂ 4	
ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	විශේෂ	වර්ෂ 4	
ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය				
ශාස්ත්‍රවේදී උපාධිය	5	සාමාන්‍ය	වර්ෂ 3	දෙමළ
ඉස්ලාමීය චින්තනය සහ ශිෂ්ඨාචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ	වර්ෂ 4	දෙමළ
ඉස්ලාමීය බැංකුකරණය සහ මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි
ඉස්ලාමීය නීතිය සහ නීති සම්පාදනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		දෙමළ
අරාබි භාෂාව සහ සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		අරාබි සහ දෙමළ
වාග් විද්‍යාව හා පරිවර්තනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය	6	විශේෂ		අරාබි, ඉංග්‍රීසි සහ දෙමළ
දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය (කලා හා සංස්කෘතික පීඨය සමග සහයෝගී වැඩසටහනක් ලෙස)	6	විශේෂ		ඉංග්‍රීසි
ඉංජිනේරු පීඨය				
විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය	7	විශේෂ	වර්ෂ 4	ඉංග්‍රීසි
තාක්ෂණ පීඨය				
කෘෂි තාක්ෂණය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය	6	විශේෂ	වර්ෂ 4	ඉංග්‍රීසි
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය	6	විශේෂ		ඉංග්‍රීසි

වගුව 1.3: සහතිකපත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා (බාහිර)

සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා			
පාඨමාලාවේ නම	**SLQF මට්ටම**	**කාලසීමාව**	**මාධ්‍යය**
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍රය	1	මාස 06	ඉංග්‍රීසි
ඩිප්ලෝමා පාඨමාලා (පශ්චාත් උපාධි නොවන)			
පාඨමාලාවේ නම	**SLQF මට්ටම**	**කාලසීමාව**	**මාධ්‍යය**
උපදේශනය පිළිබඳ වෘත්තීමය ඩිප්ලෝමාව	3	මාස 18	දෙමළ
ඉංග්‍රීසි ඩිප්ලෝමාව	3	මාස 12	ඉංග්‍රීසි
ජනමාධ්‍යවේදී ඩිප්ලෝමාව	3	මාස 12	දෙමළ

වගුව 1.4: මූලික උපාධි පාඨමාලා (බාහිර)

මූලික උපාධි පාඨමාලා (බාහිර)				
පාඨමාලාවේ නම	**SLQF මට්ටම**	**විශේෂ/සාමාන්‍ය**	**කාලසීමාව**	**මාධ්‍යය**
කලා හා සංස්කෘතික පීඨය				
ශාස්ත්‍රවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	දෙමළ
කළමනාකරණ හා වාණිජ පීඨය				
ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	ඉංග්‍රීසි සහ දෙමළ
වාණිජවේදී උපාධිය	5	සාමාන්‍ය	අවුරුදු 3	

පශ්චාත් උපාධි අධ්‍යයන

කලා හා සංස්කෘතික පීඨය, කළමනාකරණ හා වාණිජ පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය සහ තාක්ෂණ පීඨය විසින් පශ්චාත් උපාධි වැඩසටහන් පිරිනමනු ලබයි. (1.5 වගුව). 2020 වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් දර්ශණපති උපාධිධාරීන් 04 ක්, ව්‍යාපාර පරිපාලනපති උපාධිදාරීන් 14 ක් සහ ශාස්ත්‍රපති උපාධිදාරීන් 03 ක් බිහි කරන ලදී.

වගුව **1.5: පශ්චාත් උපාධි පාඨමාලා**

පීඨය	පශ්චාත් උපාධි පාඨමාලා	SLQF මට්ටම	පූර්ණ කාලීන/ අර්ධ කාලීන	කාල සීමාව	මාධ්‍යය
කලා හා සංස්කෘතික පීඨය					
	දෙමළ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	8	අර්ධ	අවුරුදු 01	දෙමළ
	දෙමළ ශාස්ත්‍රපති උපාධිය	10	අර්ධ	අවුරුදු 02	දෙමළ
	දෙමළ දර්ශණවේදී උපාධිය	11	අර්ධ / පූර්ණ	අවුරුදු 02	දෙමළ
	භූගෝල විද්‍යාව දර්ශණවේදී උපාධිය	11	අර්ධ / පූර්ණ	අවුරුදු 02	දෙමළ /ඉංග්‍රීසි
	දර්ශන විද්‍යාව දර්ශණවේදී උපාධිය	11	අර්ධ / පූර්ණ	අවුරුදු 02	දෙමළ /ඉංග්‍රීසි
	දේශපාලන විද්‍යාව දර්ශණවේදී උපාධිය	11	අර්ධ / පූර්ණ	අවුරුදු 02	දෙමළ /ඉංග්‍රීසි
	සමාජ විද්‍යා දර්ශණවේදී උපාධිය	11	අර්ධ / පූර්ණ	අවුරුදු 02	දෙමළ /ඉංග්‍රීසි
	දෙමළ ආචාර්ය උපාධිය	12	අර්ධ / පූර්ණ	අවුරුදු 03	දෙමළ /ඉංග්‍රීසි
	භූගෝල විද්‍යාව ආචාර්ය උපාධිය	12	අර්ධ / පූර්ණ	අවුරුදු 03	දෙමළ /ඉංග්‍රීසි
	දර්ශන විද්‍යාව ආචාර්ය උපාධිය	12	අර්ධ / පූර්ණ	අවුරුදු 03	දෙමළ /ඉංග්‍රීසි
	දේශපාලන විද්‍යාව ආචාර්ය උපාධිය	12	අර්ධ / පූර්ණ	අවුරුදු 03	දෙමළ /ඉංග්‍රීසි
	සමාජ විද්‍යා ආචාර්ය උපාධිය	12	අර්ධ / පූර්ණ	අවුරුදු 03	දෙමළ /ඉංග්‍රීසි
කළමනාකරණ හා වාණිජ පීඨය					
	කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDM)	8	පූර්ණ	අවුරුදු 01	ඉංග්‍රීසි
	ව්‍යාපාර පරිපාලනපති උපාධිය (MBA)	10	පූර්ණ	අවුරුදු 02	ඉංග්‍රීසි
ව්‍යවහාරික විද්‍යා පීඨය					
	ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	8	අර්ධ	අවුරුදු 01	ඉංග්‍රීසි
තාක්ෂණ පීඨය					
	ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ ආචාර්ය උපාධිය	12	පූර්ණ	අවුරුදු 03	ඉංග්‍රීසි
			අර්ධ	අවුරුදු 4.5	ඉංග්‍රීසි
	ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ දර්ශණවේදී උපාධිය	11	පූර්ණ	අවුරුදු 02	ඉංග්‍රීසි
			අර්ධ	අවුරුදු 03	ඉංග්‍රීසි

ආරම්භ කිරීමට නියමිත නව අධ්‍යයන වැඩසටහන්

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් රටේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි නව උපාධි පාඨමාලාවන් බොහොමයක් හඳුන්වා දීමට පියවර ගෙන ඇත. කලා සහ සංස්කෘතික පීඨය මඟින් අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය සඳහා අනුමැතිය ලබාගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාව වෙත යෝජනාවක් ඉදිරිපත් කර ඇත. මේ අතර කලා සහ සංස්කෘතික පීඨය විසින් ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය ආරම්භ කිරීමට යෝජනාවක් සකස් කර අදාළ බලධාරීන්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

කළමනාකරණ හා වාණිජ පීඨය විසින් කළමනාකරණ තොරතුරු තාක්ෂණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) උපාධිය සහ ව්‍යවසායකත්වය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) උපාධිය ආරම්භ කිරීම සඳහා යෝජනා සකස් කරමින් පවතී.

ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් පරිගණක විද්‍යා ඩිප්ලෝමා වැඩසටහන සඳහා යෝජනාවක් සකස් කර ඇති අතර පීඨ මණ්ඩලයේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. තවද, ජීව විද්‍යා, රසායන විද්‍යා, භෞතික විද්‍යා, පරිගණක විද්‍යා සහ ව්‍යවහාරික සංඛ්‍යානය සහ ගණිතය වැනි අධ්‍යයන මණ්ඩල පිහිටුවීමත් සමඟ ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් පර්යේෂණ පශ්චාත් උපාධි වැඩසටහන් ආරම්භ කිරීමට නියමිතය.

ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය විසින් ඉස්ලාම් බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන ආරම්භ කිරීම සඳහා යෝජනාවක් සකස් කරමින් සිටියි. තවද, අරාබි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර වැඩසටහන් ආරම්භ කිරීමට සනාතන සභාවේ සහ පාලක මණ්ඩලයේ අනුමැතිය පීඨය බලාපොරොත්තුවෙන් සිටී.

ලෝක ශ්‍රේණිගත කිරීම්

වෙබ් දර්ශක ශ්‍රේණිගත කිරීම් අනුව 2021 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය 8029 වන ස්ථානයේ සිටී. අධ්‍යාපන ආයතන වඩා හොඳ සේවාවක් ලබා දීමට දැඩි උත්සාහයක් දරනා ඉතා තරඟකාරී ලොවක ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය ලෝක ශ්‍රේණිගත කිරීම් තුල පවතින ස්ථානයෙන් ඉහල යාම සඳහා අවශ්‍ය වැඩි දියුණු කිරීම් සිදුකිරීමට පියවර ගෙන තිබේ.

ශිෂ්‍ය ප්‍රජාව

2020 දෙසැම්බර් වන විට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ජනගහනය 5558 කි. එක් එක් පීඨය අතර සිසුන්ගේ සමානුපාතික ව්‍යාප්තිය 1.6 වගුවෙහි දැක්වේ.

වගුව 1.6: 2020 දෙසැම්බර් 31 වන විට පීඨ අනුව ශිෂ්‍ය ව්‍යාප්තිය

පීඨය	ශිෂ්‍ය සංඛ්‍යාව	ප්‍රතිශතය
කලා හා සංස්කෘතික	1183	21
කළමනාකරණ හා වාණිජ	1277	23
ව්‍යවහාරික විද්‍යා	769	14
ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා	1274	23
ඉංජිනේරු	441	8
තාක්ෂණ	614	11

සේවක ප්‍රජාව

2020 දෙසැම්බර් වන විට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සේවක ප්‍රජාව (ස්ථීර කාර්ය මණ්ඩලය) 662 කි. කාණ්ඩය අනුව සේවකයින්ගේ සමානුපාතික ව්‍යාප්තිය රූප සටහන 1.1 හි දැක්වේ.



රූප සටහන 1. 1: 2020 දෙසැම්බර් වන විට සේවක ප්‍රජාවේ සමානුපාතික ව්‍යාප්තිය

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ව්‍යාප්තිය

තනතුර සහ අධ්‍යාපන මට්ටම අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර) විහිදීම රූප සටහන 1.2 හා 1.3 මඟින් පෙන්නුම් කරයි.



රූපසටහන 1.2:
2020 දෙසැම්බර් 31 දිනට තනතුර අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර) විහිදීම



රූපසටහන 1.3:
2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන මට්ටම අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර) විහිදීම

තිරසාර සංවර්ධනය

උපාය මාර්ගික සැලැස්මේ (2019-2023) තිරසාර සංවර්ධනයට අදාලව 6 වන ඉලක්කයේ 6.4 සහ 6.6 පරමාර්ථය යටතේ ඒකාබද්ධ කර ඇති උපාය මාර්ගයන්, මූලික කාර්යසාධන දර්ශක (KPIs) සහ ඉලක්කයන්, 2020 වර්ෂය තුලදී ලභා කර ගත් ආකාරය පහත දක්වා ඇත

6 වන ඉලක්කය: යහපාලනය සහ තිරසාරභාවය.

6.4 පරමාර්ථය: විවිධාංගීකරණය වූ ආදායම් මාර්ග නිර්මාණය කිරීම සහ හොඳ මූල්‍ය කළමනාකරණයක් ඇති කිරීම තුළින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය තිරසාරභාවය ඉහළ නැංවීම.

6.6 පරමාර්ථය: තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය සඳහා අපගේ කාර්ය මණ්ඩලය සහ ආයතනික කැපවීම් වැඩි දියුණු කිරීම.

වගුව 1.7: 6 වන ඉලක්කයේ 6.4 සහ 6.6 පරමාර්ථය යටතේ මූලික කාර්ය සාධන දර්ශකයට අදාලව 2020 වර්ෂයේදී ලබා ඇති ජයග්‍රහණ.

යොමු අංකය	උපායමාර්ගයන්	මූලික කාර්යසාධන දර්ශක (KPIs)	ඉලක්කය	2020 දී ජයග්‍රහණ
6.4.1	ශ්‍රී.අ.වි.වි.යේ උපායමාර්ගික සැලැස්ම සහ ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් රැස් කිරීමේ අරමුණින් විභව තරඟකාරී ආධාර සහ අනුග්‍රාහක ප්‍රභවයන් සෙවීම, ප්‍රචාරණය කිරීම සහ ලංසු තැබීම සඳහා විශ්වවිද්‍යාලයේ අරමුදල් රැස් කිරීමේ කමිටුවක් පිහිටුවීම.	මුළු ආදායමෙන් උත්පාදනය කරන ලද (ප්‍රදාන නොවන) වාර්ෂික ආදායමේ ප්‍රතිශතය	2023 වන විට මුළු ආදායමයෙන් උත්පාදනය කරන ලද (ප්‍රදාන නොවන) වාර්ෂික ආදායමේ ප්‍රතිශතය අවම වශයෙන් 10% දක්වා වැඩි කිරීම.	පහත සඳහන් ප්‍රභවයන්ගෙන් 2020 වර්ෂය සඳහා ආදායම් රු. 24,822,561 ක් විය: ලියාපදිංචි කිරීම, විභාග, පොලී, විකුණුම්, දඩ සහ වෙනත් ප්‍රභවයන්
6.4.2	උසස් අධ්‍යාපනයට වැඩි ප්‍රවේශයක් ලබා දීම සඳහා රජයේ ප්‍රතිපත්තිවල වැඩි ඉඩකඩක් ලබා දෙමින් අරමුදල් වැඩි කිරීම සඳහා රාජ්‍ය බලධාරීන්ට ඒත්තු ගැන්වීම.	කුවේට් අරමුදල් අවස්ථා භාවිතා කිරීම	2023 වන විට ප්‍රධාන සැලැස්ම යටතේ ඉතිරි ව්‍යාපෘතිවලින් අවම වශයෙන් 50% ක් සඳහා මුදල් යෙදවීම සඳහා කුවේට් අරමුදල් අවස්ථා භාවිතා කිරීම වැඩි කිරීම	2020 වර්ෂය සඳහා කුවේට් ව්‍යාපෘතිය මගින් වෙන් කර ඇති මුදල රු. මිලියන 64.5 කි.
6.4.3	ප්‍රති ආයෝජනය සඳහා අතිරික්තයක් ඇති කරන මූල්‍යමය වශයෙන් ශක්‍ය අධ්‍යයන වැඩසටහන් සහ ව්‍යාප්ති ක්‍රියාකාරකම් පුළුල් පරාසයක් හඳුන්වා දීමට පීඨ, බාහිර උපාධි	වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදාන අනුපාතයට වාර්ෂිකව රැස්කරන ලද තරඟකාරී ප්‍රදානය	වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදාන අනුපාතයට වාර්ෂිකව රැස්කරන ලද තරඟකාරී ප්‍රදානය 2023 වන විට අවම වශයෙන්	අධ්‍යයන වැඩසටහන් තුලින් අරමුදල් උත්පාදනය සඳහා ක්‍රියාත්මක වන එකම කේන්ද්‍රීය ඒකකය බාහිර උපාධි හා වෘත්තීය

	සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ ඒකකය (CEDPL) සහ අනෙකුත් ක්‍රියාකාරී ඒකක දිරිමත් කිරීම.		0.3:1 දක්වා වැඩි කිරීම.	අධ්‍යාපන මධ්‍යස්ථානයයි. මිලියන 23.366: 322
6.4.4	පවත්නා හා විභව බාහිර / අර්ධ-කාලීන වැඩසටහන් සඳහා වැඩි සිසුන් ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි ඉගැන්වීම්, ඉගෙනුම්, කළමනාකරණ සහ අලෙවිකරණ උපායමාර්ග පුනර්ජීවනය කිරීම	අවශෝෂණ ධාරිතාව: ප්‍රාග්ධන ප්‍රදානයේ ප්‍රතිශත භාවිතය (බෙදා හැරීම)	වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදානයේ ප්‍රතිශත භාවිතය (එනම් බෙදා හැරීම) අවම වශයෙන් 95% දක්වා වැඩි කිරීම.	ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ශූන්‍ය වේ. සටහන: ස්වයං අරමුදල් උත්පාදනය බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් සිදු කරයි.
6.4.5	බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි ව්‍යාපාරික ආකෘතිය ප්‍රතිසංස්කරණය කිරීම මඟින් විවිධ පීඨ/ විශ්වවිද්‍යාලවල සහයෝගයෙන් මූල්‍යමය වශයෙන් ශක්‍යතාවය සහිත බහු කාර්ය අධ්‍යයන/ වෘත්තීය වැඩසටහන් ඉදිරිපත් කළ හැකිය.	එක් සිසුවෙකු සඳහා වන පිරිවැය අඩු කිරීම	2023 වන විට එක් සිසුවෙකුගේ පිරිවැය 4% කින් අඩු කිරීම.	2019 වසරට සාපේක්ෂව එක් සිසුවෙකුගේ පිරිවැයෙහි සුළු වැඩිවීමක් සිදු වී ඇත.
6.4.6	විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාවල ගුණාත්මය ඉහල නැංවීම සහ එය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්වීම.			මූල්‍ය වාර්තා සාමාන්‍යයෙන් මූල්‍ය කමිටුවට ඉදිරිපත් කරනු ලබන අතර එම වාර්තා සියළු පීඨයන්ට යවනු ලැබේ. මේ අතර, වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි.
6.4.7	පීඨ, ඒකක සහ සමස්තයක් වශයෙන් විශ්වවිද්‍යාලයේ කාර්තුමය මූල්‍ය / අයවැය ප්‍රගතිය අභ්‍යන්තරව ප්‍රකාශයට පත් කිරීම. එමඟින් විනිවිදභාවය, ගුණාත්මක මූල්‍ය පරීක්ෂාව සහ වගවීම බලාත්මක කිරීම			මෙහෙයුම් ගුණාත්මකභාවය සහ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා, වාර්තා පීඨාධිපතිවරුන් සහ අනෙකුත් අදාළ දෙපාර්තමේන්තු වෙත බෙදා හරිනු ලැබේ.
6.4.8	ආයතනික තිරසාරත්වයට පාදක වන ප්‍රාග්ධනය, පර්යේෂණ සහ මානව සංවර්ධන ක්‍රියාකාරකම් මත උපයන ලද ආදායම			පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධනය සඳහා මිලියන 2ක් වෙන් කරන ලදී.

	ප්‍රති ආයෝජනය කිරීම වැඩි කිරීම.			
6.4.9	අපගේ මූල්‍ය අවශෝෂණ ධාරිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාලයේ අගය එකතු නොකරන පරිපාලන / ප්‍රසම්පාදන භාවිතයන් අහෝසි කිරීම.			කාර්යක්ෂම භාවිතය උදෙසා GRN , SRN හි සාම්ප්‍රදායික භාවිතයන් පරිගණක ගත කරන ලදී.
6.4.10	අනාගත සම්පත් ප්‍රතිපාදන දැනුම් දීම සඳහා පීඨ සහ ඒකකවල වියදම් ඉතිහාසය, වත්කම් උපයෝජනය සහ වගවීම භාවිතා කිරීම.			සාමාන්‍ය ක්‍රියාවලිය
6.4.11	කාර්යක්ෂම වත්කම් උපයෝජනය අධීක්ෂණය හා වැඩිදියුණු කිරීම සඳහා වත්කම් උපයෝගිතා සමීක්ෂණයක් සිදු කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.			චක්‍රලේඛ වලට අනුව, භාණ්ඩ සමීක්ෂණය සෑම වසරකම පවත්වන ලදී.
6.4.12	පුනරාවර්තන වියදම් ඉතිරි කර සිසුන් හා කාර්ය මණ්ඩල සවිබල ගැන්වීම සහ සුභසාධන කටයුතු සඳහා එය භාවිතා කිරීම			උපදෙස් සහ පාලිත යාන්ත්‍රණය අදාළ ප්‍රධානීන් විසින් අනුගමනය කරනු ලැබේ.
6.6.1.	තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය මගින් අපගේ ඉගැන්වීම්, ඉගෙනීම්, ප්‍රසම්පාදනය සහ කළමනාකරණ උපාය මාර්ග දැනුම් දීම සඳහා අපගේ ආයතනික ප්‍රතිපත්ති රාමුව සංවර්ධනය කිරීම.	උසස් අධ්‍යාපනය සඳහා සිසුන්ගේ ඇතුළත්වීම.	2023 වන විට තවත් 25%කින් ඇතුළත්වීම් වැඩි කර ගැනීම.	2017/2018 සහ 2018/2019 අධ්‍යයන වර්ෂ සඳහා ඇතුලත්වීම් වූයේ: පිළිවෙලින් 1540 සහ 1521 කි.
6.6.2	තිරසාර සංවර්ධන උපායමාර්ග විෂයමාලා තුලින් අපගේ ඉගෙනුම්, ඉගැන්වීම් හා ඇගයුම් ක්‍රමෝපායන් සමඟ ඒකාබද්ධ කිරීම.	බලශක්ති කාර්යක්ෂමතා ව: ඒක පුද්ගල විදුලි පරිභෝජනය	2023 වන විට අවම වශයෙන් 5%කින් ඒක පුද්ගල විදුලි පරිභෝජනය අඩු කිරීම. (එක් සිසුවෙකුට විදුලි පරිභෝජනය)	සාමාන්‍ය මාසික පරිභෝජනය : ඒකක 17.5/ ශිෂ්‍යයෙකුට

6.6.3	වැඩිදියුණු කල සැලසුම්, අධීක්ෂණ සහ ඵලදායී වගවීමේ මිණුම් තුලින් විදුලිය හා ජල සම්පත් තිරසාර පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම.	ඒක පුද්ගල ජල පරිභෝජනය	2023 වන විට අවම වශයෙන් 5%කින් ඒක පුද්ගල ජල පරිභෝජනය අඩු කිරීම. (එක් සිසුවෙකුට ජල පරිභෝජනය)	සාමාන්‍ය මාසික පරිභෝජනය : ඒකක 1.29/ ශිෂ්‍යයෙකුට
6.6.4	තිරසාරභාවය පිළිබඳ විධිමත් හා වෘත්තීය විගණනය තුළින් තිරසාරභාවය සඳහා වූ අපගේ කැපවීම තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීම			පහසුකම් සම්පාදනය කරන ලදී.
6.6.5	තිරසාර සංවර්ධන අරමුණු කරා ළඟාවීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශිෂ්‍යයින්, කාර්ය මණ්ඩලය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ මහජනතාව වෙත නිරන්තර දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.			වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ශිෂ්‍ය සහාය සේවා ඒකකය, පීඨ සහ පුස්තකාල සෑම වසරකම එවැනි වැඩසටහන් පවත්වනු ලැබේ.
6.6.6	පුනර්ජනනීය / පිරිසිදු බලශක්ති ප්‍රභවයන් සහ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම.			අපජලය පවිත්‍රාගාරයක් ඉදි කිරීම: (වගුව 1.8)

පරිසරය සුරැකීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග.

<u>අඛණ්ඩ පරිසර ආරක්ෂණ ක්‍රියාකාරකම්</u>

1. වාර්ෂික රුක් රෝපණ වැඩසටහන
   - විශ්වවිද්‍යාල නිර්මාතෘ දිනය
   - වසරේ පළමු දිනය
   - නිදහස් දිනය
   - රටේ ජාතික රුක් රෝපණ වැඩසටහන

     උදා: ශාක වල නම්: කුඹුක්, කායා බක් මී, කළුවර, මී, මහෝගනී, රඹුටන් සහ මදටිය.

2. කාලීන වැඩසටහන්
   - වැසි සමය ආරම්භ වීමට පෙර, බහු වාර්ෂික ශාක රෝපණය කිරීම සඳහා තෝරාගත් ස්ථානයක් සකස් කිරීම.
   - වෘක්ෂලතා ආදියේ සෞන්දර්යාත්මක අගය වැඩි දියුණු කිරීම සඳහා ජීව විද්‍යාත්මක ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීමට ගස් හා පඳුරු කප්පාදු කිරීම.
   - කලියෝදායි ගං තීරයේ කුඹුක් ගස් සිටුවීම.
   - විශ්වවිද්‍යාලයේ පවත්නා ජෛව විවිධත්වය පවත්වාගෙන යාම.

3. මාසික වැඩසටහන්
   - හිඩැස් පිරවීමේ රෝපිත ප්‍රදේශ උදා: මාර්ග පැත්ත සහ ගංගා පැත්ත
   - නව භූමි අලංකරණ ප්‍රදේශ ස්ථාපිත කිරීම.

4. දෛනික වැඩසටහන්
   - වියළී වැටෙන කොළ එකතු කිරීම සහ කොම්පෝස්ට් නිෂ්පාදනය
   - අනාගතයේ රෝපණය කිරීම සඳහා පැළ තවානක අළුත් පැළ ස්ථාපිත කිරීම.

- ආහාර අපද්‍රව්‍ය, පොලිතින් අපද්‍රව්‍ය සහ කඩදාසි අපද්‍රව්‍ය වෙන වෙනම එකතු කිරීම සඳහා විවිධ වර්ණ කුණු බඳුන් තබා ඇත. එකතු කරන ලද කසළ අඩ්ඩාලච්චේන ප්‍රදේශීය සභාවේ කුණු එකතු කිරීමේ මධ්‍යස්ථානය වෙත ගෙන යනු ලැබේ.

- කලියෝදායී ගඟ අසබඩ විශ්වවිද්‍යාලයේ නැගෙනහිර කොටසේ බෑදනය පාලනය කිරීම සඳහා ගල් වැටි ඉදිකිරීම.

- අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම: පිරිසිදු කරන ජලයෙන් කොටසක් විසිතුරු උද්‍යානය සඳහා යොදා ගනී. අපජල පවිත්‍රාගාරය සඳහා ජලය එකතු කිරීම පිළිබඳ විස්තර 1.8 වගුවේ දක්වා ඇත.

වගුව 1.8: අපජල පවිත්‍රාගාරය සඳහා අප ජලය එකතු කිරීමේ විස්තර

අනු අංකය	ස්ථානය	දිනකට ජලය එකතු කිරීම (m3/දිනකට)	පෙහවුම් වල තුල පෙහවූ ජලයෙන් 35%	පවිත්‍රාගාරය සඳහා ජලය එකතු කිරීම. (m3/දිනකට)
01	හෙල බොජුන් ආපන ශාලාව	3.00	1.05	1.95
02	FVG - 01	31.00	සෘජුවම STP වෙත යවයි.	31.00
03	FVG - 01(A)	48.00	16.8	31.20
04	FVB - 01	21.00	7.35	13.65
05	FVB - 02	48.00	16.8	31.20
06	FVB - 03	48.00	සෘජුවම STP වෙත යවයි.	48.00
07	සේවක නිළ නිවාස	6.00	සෘජුවම STP වෙත යවයි.	6.00
එකක 20.00 කි				163.00
රවුම් හතරක්		එකක 20.00 කි		-80.00
පවිත්‍ර කරන ලද ජල නිමවුමේ ඉතිරිය				83.00
උද්‍යාන වගා කටයුතු සඳහා නැවත යොදා ගත් පිරිපහදු කල ජලය				20.00

STP-අපජල පවිත්‍රාගාරය (Sewerage Treatment Plant)

- විශ්වවිද්‍යාලයේ සත්ව හා ශාක විවිධත්වය පවත්වාගෙන යන ලදී.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයීය පුස්තකාල

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පුස්තකාල යනු, ප්‍රධාන පුස්තකාලය, ව්‍යවහාරික විද්‍යා පීඨ පුස්තකාලය සහ විශ්වවිද්‍යාල සංස්කෘතික කෞතුකාගාරය ඇතුලත් වූ පුස්තකාල සහ කෞතුකාගාරයෙහි ජාලයකි. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පුස්තකාලය උපායමාර්ගිකව ක්‍රියා කරන අතර තත්ත්ව සහතිකකරණය සඳහා ජාත්‍යන්තර හොඳම භාවිතයන් පරිශීලනය කරයි. 2020 දී පුස්තකාලයේ ප්‍රධාන ජයග්‍රහණ වූයේ;

i) පර්යේෂණ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්, රචනා සොරාගැනීම් හඳුනාගැනීමේ සේවා, සාහිත්‍ය සෙවීම් සහ ලේඛන බෙදා හැරීමේ සේවා ආදිය පැවැත්වීම මගින් පීඨ සහ සිසුන් සමඟ සම්බන්ධ වීම ශක්තිමත් කිරීම සහ පර්යේෂණ සඳහා පුස්තකාල විද්වතුන්ගේ වැඩි දායකත්වය ප්‍රවර්ධනය කිරීම.

ii) ඩිජිටල්කරණ වැඩසටහන කළමනාකරණය කිරීම සහ විද්වත් බෙදා හැරීම් සඳහා පහසුකම් සපයන, ආයතනයේ ශිෂ්‍යත්ව වල සමස්ත පළල ප්‍රදර්ශනය කරන සහ විශ්වවිද්‍යාලයේ වෙබෝමෙට්‍රික් ශ්‍රේණිගත කිරීම් ඉහල නංවන ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ආයතනික සුරක්ෂිතාගාරය (DSpace) තුල බුද්ධිමය ප්‍රාග්ධනය සංරක්ෂණය කිරීම. 2020 දෙසැම්බර් 31 වන විට විද්‍යුත් සුරක්ෂිතාගාරයෙහි විද්වත් ලිපි 4204ක් සංරක්ෂණය කර තිබූ අතර ඉන් 896ක් 2020 තුළ ඇතුලත් කරන ලදී. විදේශ රටවල් ද ඇතුළුව විද්වත් ලිපි සඳහා දර්ශනය කිරීම් 48,793ක් තිබුණි.

iii) පීඨ සඟරා, කාර්ය වාර්තා සහ විශ්වවිද්‍යාල ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම සඳහා විශ්වවිද්‍යාලයට උපදේශන උපදෙස් සහ කතුවැකි සහාය ලබා දී ඇත.

iv) උපාධි අපේක්ෂකයින් සඳහා ‘‘තොරතුරු සාක්ෂරතා වැඩසටහන්’’ පිළිබඳ වෛකල්පිත සම්මාන පාඨමාලාවක් ඉගැන්වීම සහ තක්සේරු කිරීම

v) කොවිඩ් 19 සමයේ විශ්වවිද්‍යාලය වසා තැබූ කාලය තුල අපගේ අනුග්‍රාහකයින්ට දුරස්ථව සිට පුස්තකාල ඉගෙනුම් සම්පත් වෙත ප්‍රවේශවීම සඳහා පුස්තකාල සේවාව විශ්වවිද්‍යාලයෙන් පරිබාහිරව ලබා දීමට සිසුන් ඇතුළු ප්‍රධාන විශ්වවිද්‍යාල පාර්ශ්වකරුවන් සමඟ සාමූහිකව සහ නිර්මාණාත්මකව කටයුතු කිරීම.

vi) "සමකාලීන ජපානය අවබෝධ කර ගැනීම සඳහා ජපානය පොත් 100 කියවන්න" වැඩසටහන යටතේ ජපානයේ තානාපති කාර්යාලයෙන් 829,700.39ක් වටිනා ප්‍රධාන හා කැපී පෙනෙන පරිත්‍යාගයක් ලැබුණි. ශ්‍රී ලංකාවේ ජපාන තානාපති අතිගරු සුගියාමා

අකිරා මහතා පුස්තකාලයට පැමිණ 2020 සැප්තැම්බර් 28 වැනි දින එම එකතුව භාර දෙන ලදී.

vii) 5S පද්ධතියට අනුගතවීම සඳහා පුස්තකාල සේවාවන්හි ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි විධිමත් කිරීමට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පුස්තකාලය පියවර ගෙන ඇත.

viii) පුස්තකාල අධ්‍යයන කාර්ය මණ්ඩලය ආයතනික සමාලෝචනය සඳහා විශ්වවිද්‍යාලයට සක්‍රීයව දායක විය. සමාලෝචන කණ්ඩායම 2020.02.25 දින ප්‍රධාන පුස්තකාලයට සහ 2020.02.21 දින විද්‍යා පුස්තකාලයට ගොස් පුස්තකාල පද්ධතිය සහ සේවාවන් අගය කළහ.

ix) කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාලය වසා දැමීමේදී ශිබොලෙත් (Shibboleth) ප්‍රවේශය භාවිතා කිරීමෙන් එමරල්ඩ් (EMERALD), **ටේලර් සහ ෆ්‍රැන්සිස්** (TAYLOR & FRANCIS) සහ ඔක්ස්ෆර්ඩ් (OXFORD) වැනි විද්‍යුත් දත්ත පද්ධති සඳහා දුරස්ථ ප්‍රවේශ පහසුකම් සපයන ලදී. 2019 වසර සමග සසඳා බැලීමේදී පරිශීලක සංඛ්‍යා දත්ත වල ඉහල යාමක් පෙණුනි. පරිශීලකයින් විසින් 2020 වර්ශය තුල පූර්ණ පත්‍රිකා 8,593ක් බාගත කර ගෙන ඇත.

x) සියළු පීඨයන්හි අවශ්‍යතා සඳහා මෙම වසර තුලදී පුස්තකාලය විසින් රු.396,248.23 වටිනාකමින් යුත් මුද්‍රිත පොත් 465ක් පමණක් මිලදී ගෙන ඇත.

xi) 2020 දෙසැම්බර් 31 වන දිනට ලියාපදිංචි පරිශීලකයින් 3756 ක් වාර්තා වී ඇති අතර ඔවුන් අතරින් සමාලෝචිත වර්ෂය තුළ නවක සිසුන් 312 ක් පුස්තකාල සාමාජිකයින් ලෙස බඳවා ගන්නා ලදී.

xii) සංසරණය සඳහා වසංගත තත්ත්වය සැලකිය යුතු ලෙස බලපා ඇත. පුස්තකාල කළමනාකරණ පද්ධතියේ වාර්තා කර ඇති පරිදි පුස්තකාලවල මුළු පිරික්සුම් ඇතුලත්වීම්/ පිරික්සුම් පිටවීම් 31,685 ක් තිබුණි. Wifi පහසුකම් සහිත සහයෝගී පොදු ඉගෙනුම් අවකාශයන් සපයනු ලැබේ.

xiii) 2020 වර්ෂය තුලදී ප්‍රධාන පුස්තකාලය විසින් පරිශීලකයින්ගෙන් කල් ඉකුත්වීමේ දඩ ලෙස රු.69,700.00 එකතු කර ඇති අතර රු.2,549ක් විද්‍යා පුස්තකාලය විසින් එකතු කර ඇත.

ජයග්‍රහණ සහ පිළිගැනීම්:

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය 2020 UI GreenMetric ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමහි ලෝකයේ වඩාත් තිරසාර විශ්වවිද්‍යාල අතරින් 331 වන ස්ථානය ලබා ගත් අතර මෙරට ශ්‍රේණිගත කිරීම් වල 1 වන ස්ථානයට පත්විය.





- ආයතනික සමාලෝචනය 2020 පෙබරවාරි මාසයේදී සාර්ථකව නිම කරන ලදී. (2020 පෙබරවාරි 24 සිට 29 දක්වා). විශ්වවිද්‍යාලයේ අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහායක හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමූහික උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස 'B' ශ්‍රේණිය ලබා ගැනීමට හැකිවිය.

- අධ්‍යයන වැඩසටහන් හතක තත්ත්ව සහතික සමාලෝචනය අවසන් කරන ලදී. එහි දී, වැඩසටහන් තුනක් B ශ්‍රේණි ලබා ඇති අතර වැඩසටහන් හතරක් C ශ්‍රේණි ලබා ඇත. විශ්වවිද්‍යාලය තුළ තත්ත්ව සහතික පද්ධතිය වැඩිදියුණු කිරීම තුළින් අනාගත සමාලෝචන වලදී ශ්‍රේණිගත කිරීම් ඉහල නංවා ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු ආරම්භ කර ඇත.

- කොවිඩ් 19 වසංගත කාල මධ්‍යයේ වුවද අවසාන වාර පරීක්ෂණ සහ අධ්‍යයන වැඩසටහන් මාර්ගගතව සහ භෞතිකව සාර්ථකව පවත්වන ලදී.

- 2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා නව ශිෂ්‍ය කණ්ඩායම ඇතුළත් කර ගැනීමට හැකි වූ අතර අධ්‍යයන වැඩසටහන් අන්තර්ජාලය හරහා සාර්ථකව පවත්වන ලදී.

- කලා හා සංස්කෘතික පීඨය විසින් භූගෝල විද්‍යාව, දර්ශනය, දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව පිළිබඳ දර්ශණවේදී උපාධිය/ ආචාර්ය උපාධිය සහ දෙමළ භාෂාව පිළිබඳ ආචාර්ය උපාධිය ආදී පර්යේෂණ පශ්චාත් උපාධි වැඩසටහන් ආරම්භ කරන ලදී.

- කලා හා සංස්කෘතික පීඨයේ අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය හඳුන්වාදීම සඳහා යෝජනාවක් සකස් කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- කලා හා සංස්කෘතික පීඨයේ ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය හඳුන්වාදීම සඳහා යෝජනාවක් සකස් කර අදාල අධිකාරීන් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- අධ්‍යාපනය, ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණය වැනි පාඨමාලා ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහනේ නව ප්‍රධාන විශයන් ලෙස හඳුන්වා දෙන ලදී.

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 13 වන උපාධි ප්‍රදානෝත්සවය 2020 සැප්තැම්බර් මස 16 සහ 17 වන දිනයන්හිදී විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි.



- තාක්ෂණ පීඨය විසින් ශ්‍රී ලංකා තාක්ෂණ සඟරාව (SLJOT) දියත් කරන ලදී. ශ්‍රී ලංකා තාක්ෂණ සඟරාව යනු සම-සමාලෝචනය කරන ලද සඟරාවලින් එකක් වන අතර, තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රකාශිත අදාළ ක්ෂේත්‍රවල ප්‍රගතිය තවදුරටත් ඉදිරියට ගෙන යාමට අදහස් කරන කාලානුරූප ප්‍රකාශන සහිත නව පර්යේෂණ වාර්තා පළ කරන්නකි.



- තාක්ෂණ පීඨය විසින් පශ්චාත් උපාධි පර්යේෂණ වැඩසටහන සිසුන් 13ක් සමඟින් 2020 දී ආරම්භ කරන ලදී.

- උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය වැඩිකිරීමේ ජාතික ප්‍රතිපත්තිය තුලින් නවක ශිෂ්‍ය බඳවාගැනීම් වැඩිකර ගැනීමට විශ්වවිද්‍යාලයට හැකිවිය. (රූපසටහන 1.4).



සටහන **1.4** පසුගිය අධ්‍යයන වර්ෂ පහ සඳහා සිසුන් බඳවා ගැනීම

- නේවාසිකාගාර පහසුකම් සැලකිය යුතු ලෙස වර්ධනය කරන ලද අතර සුදුසුකම් සහිත සියළු සිසුන්ට නවාතැන් සපයා ඇත.



සටහන **1.5:** නේවාසිකාගාරයන්හි පදිංචිය **: 2015 - 2020**

- AHEAD - RIC (පර්යේෂණ නවෝත්පාදන සහ වාණිජකරණය) වෙතින් තාක්ෂණ පීඨය මිලියන 40ක් වටිනා පර්යේෂණ ප්‍රදානයක් ලබා ඇත.

- ජාත්‍යන්තර සහ දේශීය පර්යේෂණ සම්මන්ත්‍රණ හතරක් පැවැත්වීමට විශ්වවිද්‍යාලයට හැකිවිය.

- 2020 වර්ෂය තුළ සමස්තයක් වශයෙන් විශ්වවිද්‍යාලයට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සුචිගත කරන ලද සහ නිර්දේශිත සඟරා වල පර්යේෂණ පත්‍රිකා 128 ක් ප්‍රකාශයට පත් කළ හැකි විය.

- 2020 වර්ෂය තුල ප්‍රකාශයට පත්කරන ලද සමස්ත ප්‍රකාශන ගණන 480 කි.

- උසස් තත්ත්වයේ පර්යේෂණ කරගෙන යාමට කාර්ය මණ්ඩල සාමාජිකයින් දිරිමත් කිරීමට සහ උසස් තත්ත්වයේ සඟරාවල ප්‍රකාශයට පත් කිරීම තුලින් ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීමට, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් "උසස් බලපෑම් සහිත ප්‍රකාශන සඳහා සනාතන සභා ගෞරව" නමින් සම්මානයක් 2019 දී හඳුන්වා දෙන ලදී. 2020 දී ප්‍රදානය කරන ලද සනාතන සභා ගෞරව සම්මාන පිළිබඳ විස්තර 1.9 වගුවේ දක්වා ඇත. 1.10 සහ 1.11 වගුව මගින් විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශයට පත් කරන ලද සඟරා නිකුතු සහ 2020 වර්ෂය තුළ සිදු කරන ලද වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ පිළිබඳ විස්තර පෙන්වයි.

වගුව 1.9: 2020 වර්ෂය සඳහා සනාථන සභා ගෞරව සම්මාන

පීඨය	2020 වර්ෂයේ ඉහළ බලපෑමක් සහිත ප්‍රකාශන සඳහා සනාතන සභා ගෞරව සම්මාන ලාභීන් සංඛ්‍යාව				
	200 වන සනාතන සභාව (2020.01.22)	201 වන සනාතන සභාව (2020.05.13)	202 වන සනාතන සභාව (2020.06.24)	205 වන සනාතන සභාව (2020.08.19)	207 වන සනාතන සභාව (2020.11.13)
කලා හා සංස්කෘතික	01	01	02	02	19
කළ.හා වාණිජ	02	05	10	12	03
ඉස්ලාම් අධ්‍ය. හා අරාබි භාෂා					02
ව්‍යවහාරික විද්‍යා		01		05	05
තාක්ෂණ	01		01	01	
පුස්තකාලය				03	
එකතුව	**04**	**07**	**13**	**23**	**29**

වගුව 1.10: 2020 දී විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශයට පත්කරන ලද සඟරා නිකුතු

පීඨය	සඟරා නිකුතු
කලා හා සංස්කෘතික	කලාම් – වෙළුම 13 නිකුතු අංක 3
කළ.හා වාණිජ	අලෙවි කළමනාකරණය පිළිබඳ සඟරාව–වෙළුම 5 නිකුතු අංක 1 සහ 2
	තොරතුරු පද්ධති හා තොරතුරු තාක්ෂණ සඟරාව – වෙළුම 5 නිකුතු අංක 2
	ව්‍යාපාර ආර්ථික විද්‍යා සඟරාව – වෙළුම 2 නිකුතු අංක 1
ඉස්ලාම් අධ්‍ය. හා අරාබි භාෂා	අරාබි සහ ඉස්ලාම් අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා සඟරාව (SLJAIS)– වෙළුම 3 නිකුතු අංක 2
ව්‍යවහාරික විද්‍යා	විද්‍යා සඟරාව - වෙළුම 1 නිකුතු අංක 1
තාක්ෂණ	තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා සඟරාව – වෙළුම I නිකුතු අංක 1 සහ 2

- නව පීඨයන් හැර අනෙකුත් පීඨ හතරම ඔවුන්ගේ වාර්ෂික පර්යේෂණ සම්මේලනයන් අඛණ්ඩව පවත්වන ලදී.

වගුව 1.11: විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද වාර්ෂික පර්යේෂණ සම්මේලන සහ සම්මන්ත්‍රණ

සම්මන්ත්‍රණයේ/සම්මේලනයේ නම	2020 දී පවත්වන ලද සම්මන්ත්‍රණය/සම්මේලනය	පවත්වන ලද්දේ :
ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (Intsym)	10 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (Intsym - 2020)	ශ්‍රී.අ.වි.වි
අග්නිදිග විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර කලා පර්යේෂණ සැසිය (SEUIARS)	9 වන අග්නිදිග විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර කලා පර්යේෂණ සැසිය (SEUIARS 2020)	කලා හා සංස්කෘතික පීඨය
වාර්ෂික විද්‍යා පර්යේෂණ සැසි (ASRS)	9 වන වාර්ෂික විද්‍යා පර්යේෂණ සැසිය – 2020 (ASRS 2020)	ව්‍යවහාරික විද්‍යා පීඨය
ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	7 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - 2020	ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨය

- ඉගැන්වීම් හා ඉගෙනුම් අරමුණු සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) භාවිතය සාපේක්ෂව ඉහළ ගොස් ඇති අතර ඉගැන්වීමේ හා ඉගෙනීමේ කටයුතුවලදී ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය පවත්වාගෙන යාම සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ වැඩිදියුණු කිරීම් වෙනුවෙන් මුල පිරීම් සිදු වෙමින් පවතී.

- 2020 අවසානය වන විට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 67 දෙනෙකු ආචාර්ය උපාධිය සම්පූර්ණ කර ඇත.

- 2020 වර්ෂය අවසාන වන විට මහාචාර්ය තනතුරට උසස් කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව 10 කි.

- ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පුළුල් ලෙස සම්පූර්ණ කරන ලදී.

අසාර්ථකවීම් සහ ඊට හේතු

i. මුහුදු බාදනය විශ්වවිද්‍යාලයේ නැගෙනහිර කොටසේ දිගටම පවතී. වර්තමාන ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණයත් සමඟ විශ්වවිද්‍යාලයට මෙම ගැටළුව වළක්වා ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලය විසින් මේ පිළිබඳව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කර ඇති අතර, ගැටලුව වැළැක්වී සඳහා පියවර ගන්නා බවට ඔවුන් පොරොන්දු වී තිබේ.

ii. ගල් ඔය පිටාර ගැලීම හේතුවෙන් විශ්වවිද්‍යාලය වැසි සමයේදී ගංවතුර තර්ජනයට මුහුණ දෙමින් සිටී. ගංවතුර ආරක්ෂණ බැම්ම ස්ථාපිත කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි විය. මේ පිළිබඳව විශ්වවිද්‍යාලය විසින් අදාල බලධාරීන්ගේ අවධානයට යොමුකලද, එය ක්‍රියාත්මක නොවිණි.

iii. බදවාගැනීම්:

පහත දැක්වෙන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට විශ්වවිද්‍යාලයට නොහැකි විය,

- සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා ස්ථිර වෛද්‍ය නිළධාරීන් – සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වැඩි වැටුපකට වඩා හොඳ අවස්ථාවන් ඇති බැවින් වෛද්‍යවරුන් විශ්වවිද්‍යාල සේවයට බැඳීමට අයදුම් නොකරයි. කෙසේ වෙතත්, අර්ධ කාලීන පදනමින් පත් කරන ලද වෛද්‍ය නිලධාරීන් සමඟ සෞඛ්‍ය මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ.

- ව්‍යාපෘති කළමනාකරු - අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ඉංජිනේරුවන් අඩු වැටුපකට විශ්වවිද්‍යාලයට සේවය කිරීමට අකැමැති බැවිනි.

අනාගත සැලසුම්

i. විෂයමාලා සමාලෝචනය සඳහා ස්ථායී හා පුළුල් ප්‍රතිපත්තියක් මගින් දැනුම් දෙන අධ්‍යයන වැඩසටහන් වල විෂයමාලා සංශෝධන සිදු කිරීම.

ii. තාක්ෂණ පීඨය විසින් පළමු වරට පවත්වනු ලබන ජාත්‍යන්තර විද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණය 2021 ජූලි මාසයේදී පැවැත්වීම.

iii. තාක්ෂණ පීඨයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය මඟින් පිරිනමනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ බාහිර උපාධි වැඩසටහන ආරම්භ කිරීම.

iv. තාක්ෂණ පීඨයට ISO සහතිකය ලබා ගැනීම.

v. කලා හා සංස්කෘතික පීඨයේ පරිගණක ඒකකය තොරතුරු හා තාක්ෂණ අධ්‍යයනාංශය බවට උසස් කිරීම.

vi. විධිමත් හා සම්මත සමාලෝචනයක් සඳහා සම්මත මෙහෙයුම් ප්‍රතිපත්තියක් විධිමත්කරණය කිරීමට සියළු අධ්‍යයන වැඩසටහන් වල විෂයමාලා උස්ස කිරීම හා සමාලෝචනය කිරීම.

vii. සියළුම අධ්‍යයන වැඩසටහන් සඳහා විෂයමාලා උපදේශන වැඩසටහන් පැවැත්වීම.

viii. ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක කිරීම වැඩිදියුණු කිරීම.

ix. සමාලෝචනයට භාජනය නොකල අධ්‍යයන වැඩසටහන් තත්ත්ව සහතිකකරණ සමාලෝචනයට භාජනය කිරීම.

x. අපගේ පර්යේෂකයින්ගේ බලපෑම වැඩිකිරීමට පියවර ගැනීම.

xi. ව්‍යවහාරික විද්‍යා පීඨය යටතේ සහ කළමනාකරණ හා වාණිජ පීඨය යටතේ පිළිවෙලින් පරිගණක විද්‍යා අධ්‍යයනාංශය සහ මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය පිහිටුවීමට පියවර ගැනීම.

xii. සමාජය හා කර්මාන්ත විසින් ඉල්ලා සිටින අධ්‍යයන වැඩසටහන් ආරම්භ කිරීමට පියවර ගැනීම.

xiii. සම-සංවිධාන කාර්යයන් ස්වයංක්‍රීය කිරීම හා ඒකාබද්ධ කිරීම සඳහා පුළුල් ව්‍යවසාය පර්යේෂණ සැලසුම් හඳුන්වා දීම

xiv. විශ්වවිද්‍යාල දින දර්ශනය සහ ප්‍රතිපත්ති රාමුව සම්පාදනය කිරීම.

xv. සහයෝගී පර්යේෂණ සඳහා වෙනත් ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ නව සම්බන්ධතා සඳහා සුදුසුකම් ලැබීම.

xvi. විශ්වවිද්‍යාලයේ ප්‍රදාන සහ වෙනත් තරඟකාරී ප්‍රදාන සඳහා කාර්ය මණ්ඩලය උත්තේජනය කිරීම.

xvii. විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීමට බලපෑමක් ඇති කිරීමට රිසර්චි ගේට්, ගූගල් ස්කොලර්, ඇකඩමියා ආදී ජනප්‍රිය පර්යේෂණ ජාලයන්හි ඔවුන්ගේ පර්යේෂණ ලිපි පල කිරීම් සඳහා කාර්ය මණ්ඩලය උනන්දු කරවීම.

2. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

2019 වසරේ දෙසැම්බර් සහ 2020 වසරේ දෙසැම්බර් අවසානය වන විට ශිෂ්‍ය ප්‍රජාව හා සියළු කාණ්ඩ වල නිත්‍ය සේවකයින් පිළිබඳ විස්තර පහත 2.1 වගුව මගින් විස්තර කෙරේ.

වගුව 2.1: ශිෂ්‍ය ප්‍රජාව හා නිත්‍ය සේවකයින් පිලිබඳ තොරතුරු

පීඨය/දෙපාර්තමේන්තුව/ අංශය/ඒකකය	මුළු සිසුන්		මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය		අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය		පරිපාලන හා වෙනත් විධායක නිලධාරීන්		අනධ්‍යයන හා පරිපාලන නොවන කාර්ය මණ්ඩලය	
	2019	2020	2019	2020	2019	2020	2019	2020	2019	2020
කලා හා සංස්කෘතික පීඨය	1,176	1183	44	45	08	08	01	01		
ව්‍යවහාරික විද්‍යා පීඨය	686	769	35	32	02	02	01	01		
කළමනාකරණ හා වාණිජ පීඨය	1,264	1277	32	34	03	02	01	01		
ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨය	1,220	1274	23	23	01	01	01	01		
ඉංජිනේරු පීඨය	452	441	29	30			02	02		
තාක්ෂණ පීඨය	460	614	19	19			01	01		
පුස්තකාලය			6	06	01	01	01	01	426	420
පොදු පරිපාලනය							24	24		
බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය							01	01		
ශාරීරික අධ්‍යාපන ඒකකය					03	03				
තොරතුරු හා සංඛ්‍යාන ඒකකය					01	01				
වෘත්තිය මාර්ගෝපදේශ ඒකකය					01	01				
ජාල මෙහෙයුම් ඒකකය					01	01				
අනෙකුත් දෙපාර්තමේන්තු										
එකතුව	5,258	5,558	188	189	21	20	33	33	426	420

3. දේශීය සිසුන් පිළිබඳ විස්තර

වගුව 3.1: දේශීය සිසුන් (අභ්‍යන්තර මූලික උපාධි පාඨමාලා සඳහා නවක ඇතුලත්වීම්)

පීඨය	අධ්‍යයන වැඩසටහන	බඳවාගැනී මේ වර්ෂය	එකඟවූ බඳවා ගැනීම් ප්‍රමාණය	ලියාපදිංචි වූ ප්‍රමාණය	පාඨමාලාව හදාරන ප්‍රමාණය	බඳවාගැනී මේ වර්ෂය	එකඟවූ බඳවා ගැනීම් ප්‍රමාණය	ලියාපදිංචි වූ ප්‍රමාණය	පාඨමාලාව හදාරන ප්‍රමාණය
		2019 දෙසැම්බර් 31 දිනට				2020 දෙසැම්බර් 31 දිනට			
කලා හා සංස්කෘතික පීඨය	කලා	2017/2018	350	337	355*	2018/2019	350	355	361**
කළමනාකරණ හා වාණිජ පීඨය	කළමනාකරණ	2017/2018	140	137	137	2018/2019	140	124	124
	වාණිජ		120	103	101		120	106	106
	කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය		120	101	101		120	110	109
ව්‍යවහාරික විද්‍යා පීඨය	භෞතික විද්‍යාව	2017/2018	150	122	102	2018/2019	150	103	103
	ජීව විද්‍යාව		150	137	115		150	125	120
ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨය	අරාබි භාෂාව	2017/2018	200	185	182	2018/2019	200	177	179
	ඉස්ලාම් අධ්‍යයනය		250	243	231		250	217	213
ඉංජිනේරු පීඨය	ඉංජිනේරු	2018/2019	බඳවා ගැනීම 2020 ජනවාරි පැවැත්විණි			2018/2019	100	81	81
තාක්ෂණ පීඨය	ජෛව පද්ධති තාක්ෂණය	2017/2018	85	83	83	2018/2019	85	82	82
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය		75	71	71		75	69	69
එකතුව			1640	1519	1478	Total	1740	1549	1547

* **2016/2017** අධ්‍යයන වර්ෂය කල් දමන ලද සිසුන් 18ක් **2017/2018** දී සම්බන්ධ විය.
** **2016/2017** අධ්‍යයන වර්ෂය කල් දමන ලද සිසුන් 06 ක් **2018/2019** දී සම්බන්ධ විය.

වගුව 3.2: අභ්‍යන්තර මූලික උපාධි පාඨමාලා සඳහා දේශීය සිසුන් ඇතුලත් කර ගැනීම. (මුළු සිසුන් ගණන)

පීඨය	අධ්‍යයන වැඩසටහන	අධ්‍යයන වසර	බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොා.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)			බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොා.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)		
				පිරිමි	ගැහැණු	එකතුව		පිරිමි	ගැහැණු	එකතුව
				2019 දෙසැම්බර් 31 දිනට				**2020 දෙසැම්බර් 31 දිනට**		
කලා හා සංස්කෘතික පීඨය	කලා	1 වන වසර	2017/2018	33	322	355	2018/2019	48	313	361
	කලා	2 වන වසර	2016/2017	25	299	324	2017/2018	33	321	354
	කලා	3 වන වසර	2015/2016	35	315	350	2016/2017	25	299	324
	කලා (විශේෂ)	4 වන වසර	2014/2015	29	118	147	2015/2016	11	133	144
			උප එකතුව	**122**	**1,054**	**1,176**	උප එකතුව	**117**	**1,066**	**1,183**
කළමනාකරණ හා වාණිජ පීඨය	කළමනාකරණ	1 වන වසර	2017/2018	39	98	137	2018/2019	56	69	125
	වාණිජ			38	63	101		27	79	106
	ක.තො.තා (MIT)			19	82	101		20	88	108
	කළමනාකරණ	2 වන වසර	2016/2017	52	77	129	2017/2018	39	98	137
	වාණිජ			39	76	115		38	63	101
	ක.තො.තා (MIT)			20	92	112		19	82	101
	කළමනාකරණ	3 වන වසර	2015/2016	59	75	134	2016/2017	53	76	129
	වාණිජ			33	75	108		39	76	115
	ක.තො.තා (MIT)			22	88	110		20	92	112
	කළමනාකරණ	4 වන වසර	2014/2015	42	82	124	2015/2016	59	75	134
	වාණිජ			37	55	92		33	75	108
			උප එකතුව	**400**	**863**	**1,263**	උප එකතුව	**403**	**873**	**1,276**
ව්‍යවහාරික විද්‍යා පීඨය	භෞතික විද්‍යාව	1 වන වසර	2017/2018	49	53	102	2018/2019	44	52	96
	ජීව විද්‍යාව			21	94	115		16	104	120
	භෞතික විද්‍යාව	2 වන වසර	2016/2017	59	47	106	2017/2018	50	51	101
	ජීව විද්‍යාව			35	99	134		21	92	113
	භෞතික විද්‍යාව	3 වන වසර	2015/2016	68	33	101	2016/2017	59	47	106
	ජීව විද්‍යාව			22	73	95		35	99	134
	භෞතික විද්‍යාව	4 වන වසර	2014/2015	3	12	15	2015/2016	27	33	60
	ජීව විද්‍යාව			4	12	16		4	33	37
			උප එකතුව	**261**	**423**	**684**	උප එකතුව	**256**	**511**	**767**

පීඨය	අධ්‍යයන වැඩසටහන	අධ්‍යයන වසර	බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොා.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)			බඳවාගැනීමේ වර්ෂය	වි.වි.ප්‍ර.කොා.ස බඳවාගැනීම් (දේශීය සිසුන්)		
				පිරිමි	ගැහැණු	එකතුව		පිරිමි	ගැහැණු	එකතුව
				2019 දෙසැම්බර් 31 දිනට				**2020දෙසැම්බර් 31 දිනට**		
ඉස්ලා අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය	අරාබි භාෂාව	1 වන වසර	2017/2018	61	121	182	2018/2019	60	119	179
	ඉස්ලාම් අධ්‍යයනය			35	196	231		32	181	213
	අරාබි භාෂාව	2 වන වසර	2016/2017	60	124	184	2017/2018	61	121	182
	ඉස්ලාම් අධ්‍යයනය			39	199	238		35	196	231
	අරාබි භාෂාව	3 වන වසර	2015/2016	64	121	185	2016/2017	60	124	184
	ඉස්ලාම් අධ්‍යයනය			20	150	170		39	199	238
	අරාබි භාෂාව	4 වන වසර	2014/2015	3	12	15	2015/2016	10	12	22
	ඉස්ලාම් අධ්‍යයනය			2	13	15		6	19	25
			උප එකතුව	**284**	**936**	**1,220**	උප එකතුව	**303**	**971**	**1,274**
ඉංජිනේරු පීඨය	විද්‍යාවේදී ඉංජිනේරු	1 වන වසර	2017/2018	73	10	83	2018/2019	68	13	81
	විද්‍යාවේදී ඉංජිනේරු	2 වන වසර	2016/2017	72	16	88	2017/2018	73	10	83
	විද්‍යාවේදී ඉංජිනේරු	3 වන වසර	2015/2016	76	21	97	2016/2017	72	16	88
	විද්‍යාවේදී ඉංජිනේරු	4 වන වසර	2014/2015	80	12	92	2015/2016	76	21	97
	විද්‍යාවේදී ඉංජිනේරු	අවසන් වසර	2013/2014	71	21	92	2014/2015	80	12	92
			උප එකතුව	**372**	**80**	**452**	උප එකතුව	**369**	**72**	**441**
තාක්ෂණ පීඨය	ජෛව පද්ධති තාක්ෂණය	1 වන වසර	2017/2018	22	61	83	2018/2019	18	64	82
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය			44	27	71		53	19	72
විශ්වවිද්‍යාලය සතු ඉඩම් 2011 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කර ගිණුම් පොත් වලට හඳුනාගෙන ඇත.

විශ්වවිද්‍යාලයේ ඉල්ලීම මත රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ගිණුම් පොත් වල සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති ගොඩනැගිලි නැවත අගය කරන ලද අතර ප්‍රත්‍යාගණිත අගයන් 2020 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ගිණුම් තුල ඇතුලත් කර ඇත.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත සහ විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ඇතිව, දැනටමත් සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති හා භාවිතා වෙමින් පවතින ගෘහ භාණ්ඩ හා උපකරණ හා ක්‍රීඩා උපකරණ නැවත තක්සේරු කිරීම සඳහා කණ්ඩායම් තුනක් පත් කරන ලදී. ඒ අනුව 2020 ජූලි 01 දින සිට විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ඇතිව උපකරණ සහ ක්‍රීඩා උපකරණ වල ප්‍රත්‍යාණිත අගයන් ගිණුම් වලට ඇතුළත් කර ඇත.

ගෘහ භාණ්ඩ නැවත ඇගයීම තවමත් අවසන් කර නොමැති අතර විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ අනුමැතිය ඇතිව ප්‍රත්‍යාගණිත අගය ගිණුම්වලට ඇතුළත් කෙරේ.

(e) **සේවා කල නොහැකි දෑ බැහැර කිරීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන සංග්‍රහයේ අදාළ පරිච්ඡේදයන් සහ පසු කාලීන සංශෝධනයන් අනුගමනය කරමින්, විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ඇතිව සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති සේවා කල නොහැකි භාණ්ඩ 1,153 ක් ශ්‍රී.අ.වි.වි.යේ සේවකයින්ට වෙන්දේසි කර විකුණා ඇත.

1.1. බදු

(a) ආදායම් බදු

පවත්නා බදු ප්‍රතිපත්තිය අනුව විශ්වවිද්‍යාලය එහි ශුද්ධ ආදායම මත ආදායම් බදු ගෙවීමේ වගකීමෙන් නිදහස් වේ.

(b) උපයනවිට ගෙවීමේ බදු

ආදායම් බදු වගකීමට යටත් වන සේවකයින්ගේ මාසික වැටුපෙන් අදාල උපයනවිට ගෙවීමේ බදු අඩුකර ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරන අතර එය විශ්වවිද්‍යාලයේ වියදමට ඇතුලත් නොවේ. එබැවින් උපයනවිට ගෙවීමේ බදු විශ්වවිද්‍යාලයේ අවසන් ගිණුම් තුලින් හෙළිදරව් නොවේ.

3.3. තොග

2020 දෙසැම්බර් මස 31 වන දිනට විශ්වවිද්‍යාලය සතු තොග භෞතිකව ගණනය කර පිරිවැයට අගය කර ඇත. තොග වර්තමාන ස්ථානයට ගෙන ඒමට දරණ ලද පිරිවැය මීට ඇතුලත් අතර, FIFO ක්‍රමය මත තොග ගිණුම්ගත කර ඇත.

3.3.1

ශ්‍රී.ල.අ.වි.වි යේ උපකුලපති (ගණන් දීමේ නිළධාරී) විසින් පත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් 2020.12.31 වන දිනට තොග සත්‍යාපනය සිදු කරන ලදී.

භෞතික ප්‍රමාණයන් සත්‍යාපනය කර අගයන් ගණනය කරන ලදී. ශ්‍රී.ල.අ.වි.වි / ඔලුවිල් පරිශ්‍රයේ පිහිටි ප්‍රධාන ගබඩාවෙහි, ශ්‍රී.ල.අ.වි.වි / ඔලුවිල් පරිශ්‍රයේ පිහිටි නඩත්තු (උප ගබඩාව), සමන්තුරේ ව්‍යවහාරික විද්‍යා පීඨ උප ගබඩාවෙහි තොග වල සහතික කල අගයන් සත්‍යාපනය කර අගයන් ගිණුම් පොත් වලට ලබා ගන්නා ලදී.

3.4. වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ

වාර්තා කරන දින සිට මාස 12ක් ඇතුලත පියවිය යුතු වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ SLPSAS 01 අනුව ඇස්තමේන්තු කර දක්වා ඇත. බොල් සහ අඩමාණ ණය සඳහා වෙන්කිරීම් සිදු කර නැත.

3.4.1 බැඳුම්කර කඩ කිරීම සහ නොගෙවූ ණය

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ නොපියවූ ණය ශේෂය රු. 29,058.00 ක් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු තනතුරු අතහැර යෑම හේතුවෙන් බැඳුම්කර කඩකිරීමේ වටිනාකමේ එකතුව රු. 1,388,219.43 ක් පවතී.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඉහත සඳහන් හිඟ මුදල් අය කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග.

i. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ ශේෂයෙන් අයකර ගැනීම.

ii. නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

3.5. ස්ථාවර තැන්පතු මත ආයෝජන

ස්ථාවර තැන්පතු මත ආයෝජන පිරිවැයට පෙන්වා ඇත.

3.6. මුදල් සහ මුදල් සමාන දෑ

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පෙන්වා ඇති මුදල් සහ මුදල් සමාන දෑ යන්නට ජංගම සහ ඉතිරිකිරීමේ ගිණුම් වල ඇති මුදල් ශේෂ සහ අතැති මුදල් අයත්වේ.

3.7. වගකීම් සහ වෙන්කිරීම්

ශේෂපත්‍ර දිනට හඳුනාගන්නා ලද සියළු වගකීම් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර ඇති අතර, වටිනාකම නිවැරැදිව හඳුනාගත නොහැකි නමුත් සත්‍ය වශයෙන්ම පවතින බව හඳුනාගත් වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් සිදු කර ඇත.

ඉල්ලූවිට ගෙවීමට බැඳී සිටින වගකීම් හෝ ශේෂපත්‍ර දින සිට වසරක් ඇතුලත ගෙවීමට බැඳී සිටින වගකීම් ජංගම වගකීම් ලෙස ශේෂපත්‍රය තුල හඳුනාගෙන ඇත. ශේෂපත්‍ර දිනෙන් වසරකට පසුව ගෙවීමට බැඳී සිටින වගකීම් ජංගම නොවන වගකීම් ලෙස ශේෂපත්‍රය තුල හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.7.1 අසම්භාව්‍ය වගකීම්

2020.12.31 දිනට පවත්නා වූ උසාවි නඩු ලැයිස්තුව පහත දැක්වෙන සටහනෙහි දක්වා ඇත.
අනාගතයේදී ඇති විය හැකි වන්දි ගෙවීම් පිළිබඳ මෙම අවස්ථාවේදී අපට තක්සේරු කිරීමට නොහැකි බැවින් ඒ සඳහා කිසිදු ප්‍රතිපාදනයක් ගිණුම්වල ඇතුලත් කර නොමැත.

නඩු අංකය	අධිකරණ තොරතුරු	නඩු පිළිබඳ තොරතුරු	පුරෝකථනය කල ප්‍රතිඵලය
49110/PC/17	මහේස්ත්‍රාත් අධිකරණය, අක්කරෙයිපත්තු	ශිෂ්‍ය ප්‍රචණ්ඩ ක්‍රියාකාරකම් – පරිපාලන ගොඩනැගිල්ල	මූල්‍ය ගැටළුවක් නැත
B/10486/PC/18	මහේස්ත්‍රාත් අධිකරණය, අක්කරෙයිපත්තු	ශිෂ්‍ය ප්‍රචණ්ඩ ක්‍රියාකාරකම් – පරිපාලන ගොඩනැගිල්ල	මූල්‍ය ගැටළුවක් නැත
LT/BT/362/2018	කම්කරු විනිශ්චය සභාව, මඩකලපුව	සේවය අවසන් කිරීම පිළිබඳව	ඔහුගේ චේතනය නැවත ගෙවීමට සිදු විය හැකිය. (2017.10.02 සිට)
DCA/M/1251/19	දිසා අධිකරණය, අක්කරෙයිපත්තු	බැඳුම්කර කඩකිරීම	නීති ගාස්තුව ගෙවීමට සිදුවිය හැකිය
CA (Writ) අයදුම්පත අංක 464/2019	අභියාචනාධිකරණය, කොළඹ	තනතුරෙන් ඉවත් කිරීමට එරෙහිව	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස ආසන්න වශයෙන් රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය.
CA (Writ) අයදුම්පත අංක 301/2019	අභියාචනාධිකරණය, කොළඹ	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ඉංජිනේරු පියයේ සිසුන් සඳහා පිළිගැනීම.	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය.
SC/ FR) අයදුම්පත අංක. 146/2019	ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ	ආර්ථික විද්‍යාව සඳහා කථිකාචාර්යවරයෙකුගේ පත්කිරීම අභියෝගයට ලක් කිරීම.	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය.
SC (Spl) L.B. අංක 228/2019	ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ	අභියාචනාධිකරණය විසින් රිට් අයදුම්පත නිෂ්ප්‍රභ කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීම.	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය.
SC/FR) අයදුම්පත අංක 298/2019	ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ	ආර්ථික විද්‍යා කථිකාචාර්ය තනතුර සඳහා බඳවා ගැනීම අභියෝගයට ලක් කිරීම.	නීතිපති දෙපාර්තමේන්තුවට නීති ගාස්තුව ලෙස රු. 100,000.00 ක් ගෙවීමට සිදුවිය හැකිය.
LT/44/707-708-709/2020	කම්කරු විනිශ්චය සභාව, අම්පාර	03 ගෙවීම් සේවකයින් නැවත සේවයේ පිහිටුවීම සඳහා ඉදිරිපත් තල පැමිණිලි	නීති ගාස්තුව ගෙවීමට සිදුවිය හැකිය.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.8. පාරිතෝෂික

පාරිතෝෂික සඳහා වෙන්කිරීම් 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත අනුව සිදුකර ඇත. පාරිතෝෂික වගකීම බාහිරව මූල්‍යනය කර හෝ සත්‍ය වශයෙන් අගය කර නොමැති නමුත් ප්‍රතිපාදන වෙන් කර ඇත. පාරිතෝෂික අරමුදල් ගිණුම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇති අතර සෑම සේවකයෙකුගේම සේවය ආරම්භ කරන ලද දිනයේ සිට සේවය සම්පූර්ණ කරන ලද සෑම වර්ශයක් සඳහාම මූල්‍ය වර්ශයේ අවසාන මාසයේ වැටුපෙන් අඩක් පදනම් කරගෙන පාරිතෝෂිකය සකසා ඇත.

3.9. විශ්වවිද්‍යාල අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල

අදාල තත්ත්වයන් සහ රෙගුලාසීන්ට අනුකූල වෙමින් විශ්වවිද්‍යාල සේවකයින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට හිමිකම් කියනු ලබයි. ඒ අනුව සේවකයාගේ දල වැටුපෙන් 15%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ද, 03%ක් සේවක භාරකාර අරමුදලට ද නියමිත පරිදි ප්‍රේෂණය කෙරේ.

3.10. ප්‍රදාන ගිණුම්ගත කිරීම

විශ්වවිද්‍යාලයේ වියදම් දැරීම සඳහා ලැබෙන ප්‍රදාන අදාල වියදම හඳුනාගන්නා ලද කාලපරිච්ඡේදයේදීම ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයේ දක්වනු ලබයි. වත්කම් වල පිරිවැය දැරීම සඳහා විශ්වවිද්‍යාලය වෙත ලද ප්‍රදානයන් අදාල වත්කමේ ඵලදායී ජීව කාලය පුරා ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ප්‍රකාශනය තුල බෙදා හැරේ.

3.11. ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

සියළු ප්‍රමාණාත්මක බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් හෝ හෙලිදරවු කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදු කර ඇත.

3.12. ඒකකවල ගිණුම්කරණ තොරතුරු හෙලිදරවු කිරීම

බාහිර උපාධි සහ වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය (CEDPL)

බාහිර උපාධි සහ වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය සඳහා විශ්වවිද්‍යාලයේ ගිණුම් වලින් පරිබාහිරව වෙනම අවසන් ගිණුම් පිළියෙල කරන අතරම, එම ගිණුම් විශ්වවිද්‍යාලයේ අවසන් ගිණුම් සමග ඒකාබද්ධ කරනු ලබයි.

පශ්චාත් උපාධි ඒකක (FMC, FAC, FT)

පශ්චාත් උපාධි ඒකක (කළමනාකරණ හා වාණිජ පීඨය, කලා හා සංස්කෘතික පීඨය, තාක්ෂණ පීඨය) සඳහා විශ්වවිද්‍යාලයේ ගිණුම් වලින් පරිබාහිරව වෙනම අවසන් ගිණුම් පිළියෙල කරන අතර, එම ගිණුම් විශ්වවිද්‍යාලයේ අවසන් ගිණුම් සමග ඒකාබද්ධ කරනු ලබයි.

<u>විශ්වවිද්‍යාලයේ ඒකකයන්හි ගිණුම් ඒකාබද්ධ කිරීම.</u>

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බාහිර උපාධි සහ වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානයෙන් (CEDPL) සහ පශ්චාත් උපාධි ඒකක (FMC, FAC & FT) වලින් ලැබිය යුතු රු. 9,903,150.03 ක් සහ බාහිර උපාධි සහ වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානයට ගෙවිය යුතු රු. 13,000,000.00 ක් ඔිලවු කරන ලදී.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.13. ආදායම් ප්‍රකාශනය

3.13.1. ආදායම හඳුනාගැනීම

ආදායම හඳුනාගනු ලබන්නේ කිසියම් ආර්ථික ප්‍රතිලාභයක් විශ්වවිද්‍යාලය වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් සහිත වීම සහ නිශ්චිතව මැනිය හැනි වීමේ පදනම මතයි.

(a) ශිෂ්‍යයින්ගෙන් ලැබෙන බඳවා ගැනීමේ ගාස්තු ඒවා ලැබෙන අවස්ථාවේදී ආදායමක් ලෙස හඳුනා ගනී.

(b) විභාග, සම්මන්ත්‍රණ, පාඨමාලා සහ අනෙකුත් අධ්‍යාපන සහ ක්‍රියාකාරකම් වලට අදාල ගාස්තු අදාල ක්‍රියාකාරකම සම්පූර්ණ වීමත් සමඟ ආදායම ලෙස හඳුනා ගැනේ.

(c) ගාස්තු අයකරමින් සිදු කරන පාඨමාලා වලට අදාල ගාස්තු එක් එක් පාඨමාලාව සම්පූර්ණ වන අදියරේ වසර අවසානයේදී ආදායම් ප්‍රකාශනයට හඳුනා ගැනේ. ඉදිරි කාලපරිච්ඡේදය සඳහා ලද දේශන ගාස්තු සහ ගෙවීම් ශේෂ පත්‍රය තුල සංචිත සහ සීමා කරන ලද අරමුදල් යටතේ පෙන්වනු ලබයි.

(d) පොලී ආදායම උපචිත පදනම මත හඳුනා ගැනේ.

(e) ප්‍රදාන මඟින් ලැබෙන ආදායම හඳුනා ගනු ලබන්නේ දායකත්වය පාලනයේ හෝ දායකත්වය ලැබීමට හිමිකම තහවුරු වූ පසුවය.

(f) අනුග්‍රාහකත්වයට අදාල ක්‍රියාකාරකම් ආදායම ලද විගස හඳුනා ගැනේ.

(g) අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

3.13.2. වියදම් හඳුනාගැනීම

නිශ්චිත අයිතමයකට අදාලව ආදායම ඉපයීම සහ එහි දරණ ලද වියදම අතර ඇති සෘජු සම්බන්ධතාවය මත ආදායම් ප්‍රකාශනය තුල වියදම් හඳුනා ගනී. විශ්වවිද්‍යාලය පවත්වා ගෙන යාමට දරන ලද සියළු වියදම් සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමට දරන ලද වියදම් වසරේ අතිරික්තය/ ඌණතාවය ගණනය කිරීමේදී ආදායමට එරෙහිව කපා හැරේ. විභාග, සම්මන්ත්‍රණ, පාඨමාලා සහ අනෙකුත් අධ්‍යාපන සහ ක්‍රියාකාරකම් වලට අදාල වියදම් අදාල ක්‍රියාකාරකම අවසන් වීමත් සමඟ ආදායම් ප්‍රකාශනයට හඳුනා ගැනේ.

3.14. වාර්තා කරන දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසුව සිදුවන සිදුවීම් ඒවායේ ප්‍රමාණාත්මකභාවය මත සලකා බලන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී අදාල ගැලපීම් ගිණුම් තුල සිදු කරනු ලබයි.

.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
ගිණුම් සඳහා සටහන්
සටහන **01 -** දේපළ, පිරියත, උපකරණ හා මානව සම්පත් සංවර්ධනය

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2020.01.01 දිනට පිරිවැය	එකතු කිරීම්/ප්‍රත්‍යාගණනය කිරීම්	බැහැර කිරීම්	2020.12.31 දිනට පිරිවැය	2019.12.31 දිනට සමුච්චිත ක්ෂය	2020 වර්ශය සඳහා ක්ෂය	2020.12.31 දිනට සමුච්චිත ක්ෂය	2020.12.31 දිනට ශුද්ධ අගය
ඉඩම්	1.01	450,330,000	-	-	450,330,000	-	-	-	**450,330,000**
ගොඩනැගිලි	1.02	5,145,103,054	441,280,026	6,793,853	5,579,589,228	1,237,274,356	256,310,293	1,493,584,649	**4,086,004,579**
ලී බඩු	1.03	502,887,595	16,248,137	-	519,135,732	198,114,429	44,732,838	242,847,267	**276,288,465**
උපකරණ	1.04	1,431,641,418	52,666,270	57,004,044	1,427,303,643	819,966,980	188,498,672	1,008,465,651	**418,837,992**
පොත් සහ වාර සහරා		199,860,154	585,682	-	200,445,837	165,906,968	13,493,272	179,400,240	**21,045,597**
වාහන	1.05	114,363,388	-	-	114,363,388	103,660,826	5,664,384	109,325,210	**5,038,178**
මෘදුකාංග	1.06	5,265,505	1,323,000	-	6,588,505	1,216,247	1,266,956	2,483,203	**4,105,302**
මාර්ග	1.07	158,629,534	51,097,869	-	209,727,402	150,135,971	17,619,812	167,755,783	**41,971,619**
වැටකටුන සහ ජාල	1.08	47,672,367	-	-	47,672,367	44,068,859	3,603,508	47,672,367	**-**
විදුලි සම්ප්‍රේෂණ ජාල	1.09	50,192,158	-	-	50,192,158	18,632,431	4,543,842	23,176,273	**27,015,885**
ජල සැපයුම් ජාල	1.10	3,164,401	10,718,214	-	13,882,615	7,204,132	1,388,262	8,592,394	**5,290,221**
උපාධි ලෝගු	1.11	3,690,803	-	-	3,690,803	3,690,803	-	3,690,803	**-**
අධ්‍යයන ප්‍රකාශන/ජාත්‍යන්තර සම්මන්ත්‍රණ		18,323,463	612,880	-	18,936,343	10,846,059	2,498,590	13,344,649	**5,591,694**
අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිපුණතා සංවර්ධනය		23,123,326	3,193,452	-	26,316,778	17,255,587	2,252,321	19,507,908	**6,808,870**
තත්ත්ව සහතික හා පිළිගැනීම්		10,007,913	546,045	-	10,553,957	2,041,276	2,078,673	4,119,949	**6,434,008**
පර්යේෂණ හා අධ්‍යයන සංවර්ධන		568,000	-	-	568,000	56,800	113,600	170,400	**397,600**
ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලට සහභාගී වීම්		149,100	-	-	149,100	14,910	29,820	44,730	**104,370**
අවසන් වසර ව්‍යාපෘති		76,808	-	-	76,808	7,681	15,362	23,042	**53,766**
එකතුව		**8,165,048,986**	**578,271,575**	**63,797,897**	**8,679,522,664**	**2, 780,094,313**	**544,110,206**	**3,324,204,519**	**5,355,318,145**

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2020 රු.	2019 රු.
සටහන 02 - කෙරීගෙන යන වැඩ			
නාක්ෂණ පීඨ තෙමහල් ගොඩනැගිල්ල		-	418,069,485
ක්‍රිකට් පිටිය වැඩිදියුණු කිරීම		-	1,566,276
පිරිමි නේවාසිකාගාරය සහ සේවක නිල නිවාස සඳහා යන මාර්ගය		-	2,882,229
ගණිත විද්‍යා අධ්‍යයනාංශය සඳහා නව පරිගණක විද්‍යාගාරය		-	552,698
අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සේවක නිල නිවාස		81,164,894	26,460,000
		81,164,894	**449,530,688**
සටහන 03 - මූල්‍ය වත්කම්			
ස්ථාවර තැන්පතු	3.01	25,904,408	35,284,825
		25,904,408	**35,284,825**
ස්ථාවර තැන්පතු - ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම්			
බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ මධ්‍යස්ථානය (CEDPL)		117,776,172	108,422,086
පශ්චාත් උපාධි ඒකකය - කළමනාකරණ හා වාණිජ පීඨය		5,410,768	5,043,881
පශ්චාත් උපාධි ඒකකය - කලා පීඨය		136,078	126,262
		123,323,017	**113,592,229**
ලැබිය යුතු පොලී			
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය		199,687	-
බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ මධ්‍යස්ථානය (CEDPL)		369,574	933,153
පශ්චාත් උපාධි ඒකකය - කළමනාකරණ හා වාණිජ පීඨය		60,614	-
පශ්චාත් උපාධි ඒකකය - කලා පීඨය		1,524	-
		631,399	**933,153**
සටහන 04 - භාණ්ඩ/තොග			
ගබඩා අත්තිකාරම් ගිණුම - සැපයුම්	4.01	5,742,079	7,218,387
ගබඩා අත්තිකාරම් ගිණුම - නඩත්තු	4.02	3,372,600	3,875,016
		9,114,679	**11,093,403**

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2020 රු.	2019 රු.
සටහන 05 - ලැබිය යුතු ගිණුම්			
ආරක්ෂක තැන්පතු	5.01	5,253,929	5,253,929
ආපදා ණය	5.02	28,111,787	28,021,591
සේවක ණය	5.03	62,050	59,670
වාහන ණය	5.04	176,000	376,000
පරිගණක ණය	5.05	515,500	592,000
යතුරුපැදි ණය	5.06	349,016	489,090
උත්සව අත්තිකාරම්	5.07	292,500	518,750
වැටුප් අත්තිකාරම්	5.08	40,359	337,498
විශේෂ අත්තිකාරම්	5.09	7,600	400
බැඳුම්කර කඩකිරීම්	5.10	20,062,089	15,351,801
මහපොල ශිෂ්‍යත්ව අත්තිකාරම්	5.11	-	5,000
විවිධ අත්තිකාරම්	5.12	-	616,025
තැපැල් මුද්‍රා යන්ත්‍ර අත්තිකාරම්		32,188	51,122
පර්යේෂණ අත්තිකාරම්	5.13	129,000	50,000
පුස්තකාල පොත් / වාර සඟරා අත්තිකාරම්	5.14	-	72,820
ශ්‍රී.අ.වි.වි.ට ගෙවිය යුතු	5.15	10,399,940	8,344,042
CEDPL මඟින් ලැබිය යුතු		8,840,335	7,168,477
ලැබිය යුතු වැටුප්	5.16	3,253,494	3,748,863
MA සහ MBA පාඨමාලා වලින් ලැබිය යුතු		1,059,015	547,872
නාක්ෂණ පීඨ පශ්චාත් උපාධි ඒකකයෙන් ලැබිය යුතු		3,800	-
අන්තර් ඒකක ගනුදෙනු හිලව් කිරීම්		(9,903,150)	(6,143,637)
		68,685,451	**65,461,313**
සටහන 06 – මුදල් සහ මුදල් සමාන දෑ			
මහජන බැංකුව - 228 1001 7000 1696		10,233,836	2,016,672
මහජන බැංකුව - 228 1001 7000 1700		34,665,004	2,413,799
මහජන බැංකුව - 228 1001 9000 1704		7,826,004	1,704,773
මහජන බැංකුව - 228 1001 0000 1708		211,773	281,273
මහජන බැංකුව - 228 1001 5000 1715		17,351,344	2,680,981
මහජන බැංකුව - 064 1001 7000 0025		1,080,065	212,194
මහජන බැංකුව - 004 1001 5021 0926		-	71,169
මහජන බැංකුව - 064 1001 6000 0950		367,973	1,188,591
මහජන බැංකුව - 228 1001 6000 1692 (CEDPL)		28,937,824	5,549,197
මහජන බැංකුව - 228 10014004 2429 (CEDPL)		16,300	16,300
මහජන බැංකුව - 228 1001 2003 2544 (FMC)		14,346,142	10,603,378
මහජන බැංකුව - 228 1001 5004 0340 (FAC)		2,368,721	404,221
මහජන බැංකුව - 228 1001 6005 2714 (FT)		689,475	-
		118,094,461	**27,142,547**

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2020 රු.	2019 රු.
සටහන 07 - සීමාකාරී අරමුදල්			
අනුස්මරණ ත්‍යාග අරමුදල්	7.01	248,000	248,000
කෙටිකාලීන ICIT පාඨමාලාව		434,454	434,454
විදෙස් සිසුන් සඳහා ශිෂ්‍යත්ව		474,600	294,600
UNDP ප්‍රදාන		165,078	165,078
ආසියානු පදනමේ පර්යේෂණ ප්‍රදාන		21,074	170,773
ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය		511,421	511,421
ඉංජිනේරු පීඨය/හූ ගඩොල් පරීක්ෂා කිරීම		-	410
වි.වි.ප්‍ර.කොං. විසින් පවත්වන ලද සිසුන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන		600,000	600,000
අවසාදිත සමීක්ෂණය සහ භූ රූප සමීක්ෂණය		1,020,000	-
		3,474,626	**2,424,736**
සටහන 08 - ප්‍රාග්ධන ප්‍රදාන			
වැය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන	08.01	1,696,026,058	2,147,827,686
ප්‍රාග්ධන දායකත්වය – MRR	08.02	99,871,217	104,770,589
වැය කල ප්‍රාග්ධන ප්‍රදාන – IRQUE	08.03	80,705,973	89,032,833
ප්‍රාග්ධන දායකත්ව – කුවේට් අරමුදල	08.04	1,970,681,385	2,067,356,900
ප්‍රාග්ධන දායකත්ව – MOHE	08.05	1,149,815,100	1,206,221,462
ප්‍රාග්ධන ප්‍රදාන -වැයනොකල		78,960,578	-
පරිත්‍යාග	08.06	138,002,698	152,159,731
		5,214,063,009	**5,767,369,201**
සටහන 09 - සංචිත			
සමුච්චිත අරමුදල		(422,634,545)	(1,717,375,358)
ක්‍රමක්ෂය ශුද්ධ වටිනාකම සහ ක්ෂය (පෙර වර්ෂ ගැලපීම්)		(63,797,897)	1,524,397,044
කාලච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/උණතාවය		(16,054,534)	(229,656,231)
		(502,486,976)	**(422,634,545)**
ප්‍රත්‍යාගණන සංචිතය	09.01	510,537,790	450,200,000
		510,537,790	**450,200,000**
ස්වයං මූල්‍යකරණ පාඨමාලා අරමුදල්			
පීඨ සංවර්ධන අරමුදල - CEDPL- FAC		6,435,938	5,181,785
පීඨ සංවර්ධන අරමුදල - CEDPL - FMC		835,205	3,205,762
පීඨ සංවර්ධන අරමුදල - PGU - FAC		71,082	58,754
පීඨ සංවර්ධන අරමුදල - PGU - FMC		2,282,845	1,951,358
පීඨ සංවර්ධන අරමුදල - PGU - FT		2,000	-
පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල - CEDPL - FAC		6,100,899	5,339,462
පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල - CEDPL - FMC		2,691,502	2,409,194
පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල - PGU - FAC		106,623	88,131

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2020 රු.	2019 රු.
ස්වයං මූල්‍යකරණ පාඨමාලා අරමුදල්			
පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල - PGU - FMC		3,424,267	2,927,036
පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල - PGU - FT		1,200	-
CEDPL සංවර්ධන අරමුදල		9, 611,282	8,800,777
PGU සංවර්ධන අරමුදල - FMC		1,564,270	1,365,487
PGU සංවර්ධන අරමුදල - FAC		35,541	29,377
PGU සංවර්ධන අරමුදල - FT		2,000	-
		33,164,654	**31,357,123**
සටහන 10 – පාරිතෝෂික			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	10.01	391,361,307	336,598,036
		391,361,307	**336,598,036**
සටහන 11 - ගෙවිය යුතු ගිණුම්			
ආපසු ගෙවිය යුතු තැන්පතු -විද්‍යාගාර	11.01	657,800	745,800
ආපසු ගෙවිය යුතු තැන්පතු -පුස්තකාල	11.02	163,400	181,100
ආපසු ගෙවිය යුතු තැන්පතු - නේවාසිකාගාර	11.03	3,328,600	2,728,900
ආපසු ගෙවිය යුතු තැන්පතු - කොන්ත්‍රාත්කරුවන්	11.04	211,500	114,000
ආපසු ගෙවිය යුතු තැන්පතු - සැපයුම්කරුවන්	11.05	581,000	522,000
රැඳවුම් මුදල් - කොන්ත්‍රාත්කරුවන්	11.06	24,491,391	16,659,673
රැඳවුම් මුදල් - සැපයුම්කරුවන්	11.07	11,385,214	10,035,839
ශ්‍රී.අ.වි.වි. විසින් ගෙවිය යුතු	11.08	22,838,376	67,186,220
කලින් ලැබීම් - ස්වයං මූල්‍යකරණ පාඨමාලා		62,146,095	37,269,800
ගෙවිය යුතු - ස්වයං මූල්‍යකරණ පාඨමාලා		430,366	470,199
අන්තර් ඒකක ගනුදෙනු හිලවු කිරීම්		(13,000,000)	(10,000,000)
		113,233,742	**125,913,531**
සටහන 12 - වෙනත් ආදායම්			
ලියාපදිංචි ගාස්තු		4,203,940	4,020,155
විභාග ගාස්තු		380,675	319,780
පොළී		3,344,245	4,094,519
කුලී		2,671,568	2,663,045
විකුණුම්		2,638,937	970,284
දඩ		2,024,042	6,173,956
විවිධ ආදායම්		9,559,154	15,601,967
		24,822,561	**33,843,705**

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ගිණුම් සඳහා සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	උපලේඛනය	2020 රු.	2019 රු.
සටහන 13 - ස්වයං මූල්‍යකරණ පාඨමාලා ආදායම්			
බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ මධ්‍යස්ථානය (CEDPL)		23,366,466	27,996,860
පශ්චාත් උපාධි ඒකකය - FMC		5,392,750	8,808,386
පශ්චාත් උපාධි ඒකකය - FAC		143,984	194,500
පශ්චාත් උපාධි ඒකකය - FT		36,000	-
		28,939,200	**36,999,746**
සටහන 14 - ස්වයං මූල්‍යකරණ පාඨමාලා වියදම්			
බාහිර උපාධි සහ වෘත්තීය ඉගෙනුම් සඳහා වූ මධ්‍යස්ථානය (CEDPL)		8,478,024	11,524,416
පශ්චාත් උපාධි ඒකකය - FMC		4,748,972	9,545,259
පශ්චාත් උපාධි ඒකකය - FAC		58,174	197,238
පශ්චාත් උපාධි ඒකකය - FT		33,819	-
		13,318,989	**21,266,912**

21. විගණකාධිපතිගේ වාර්තාව 2020

ENP/BT/C/SEUSL/01/20/02 2021 ජූලි මස

උප කුලපති,
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිලිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන පරිච්ඡේදය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

තත්ත්වාගණනය කළ විගණන මතය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශණය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශණය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශණය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණය, මාගේ විධාන යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව , 2018 අංක 19 දරණ ජාතික විගණන පනත සහ 1978 විශ්වවිද්‍යාල පනත් අංක 16 හි 107(5) පරිච්ඡේදය මත මාගේ අදහස් හා නිර්දේශයන් විශ්වවිද්‍යාල පනතේ 108(1) පරිච්ඡේදය අනුව වාර්ෂික වාර්තාව මඟින් ප්‍රකාශයට පත්කළ යුතු බව මාගේ අදහසයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව, මාගේ වාර්තාව පාර්ලිමේන්තුව වෙත නියමිත කාල සීමාව තුල ඉදිරිපත් කිරීමට නියමිතය.

මාගේ විගණන මතය අනුව තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා හේතු වන කරුණුකාරණා විස්තර කර ඇති පරිච්ඡේදයට පරිබාහිරව, අනෙකුත් මූල්‍ය ප්‍රකාශණ සත්‍ය හා සාධාරණ ලෙස 2020 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරන අතර එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව අවසන් වර්ෂය සඳහා පෙන්නුම් කෙරේ.

1.2 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

(a) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි පරිච්ඡේද 65 ප්‍රකාරව, ස්ථාවර වත්කම් හී ඵලදායී ජීව කාලය, වාර්ෂිකව සමාලෝචනය කර නොමැත. රු. 483,321,635 පිරිවැය වන දේපල, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය වීමට ලක් කර තිබුන ද එම උපකරණ තවදුරටත් භාවිතයේ පවතින බව වර්ෂ අවසාන සමාලෝචනයේ දී නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ප්‍රමිත අංක 03 ප්‍රකාරව, ඇස්තමේන්තු ගත වැරදීම් හඳුනා ගැනීම සඳහා මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොමැත.

b) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි පරිච්ඡේද 69 ප්‍රකාරව, ස්ථාවර වත්කම් හී ක්ෂය වීම් ආරම්භ කල යුත්තේ, එම වත්කම් භාවිතයට ගැනිමට පටන්ගත් අවස්ථාවේ දීමය. එහෙත්, පිරිවැය රු. 39,399,513 වන රසායනාගාර උපකරණ 08 ක් 2017 සහ 2019 වසර තුල ලැබුණ ද එම උපකරණ 2021 මාර්තු මස 04 වන දින තුරුත් භාවිතයට ගැනීමට සුදානම් කර නොමැති වුව ද එවා ක්ෂය කිරීම්, එවා ලද වසර තුල සිට සිදු කර ඇත. එම හේතුව නිසා, රු. 16,505,637 සමුච්චිත ක්ෂය වීම් සහ පොදු රක්ෂිතය පිලිවෙලින් අධි තක්සේරු කර සහ අවතක්සේරු කර ඇත.

(c) 2020 වර්ෂයේ සැප්තැම්බර් මස, ස්වයං උත්පාදන ක්‍රියාකරකම් තුලින් පිරිවැය රු. 3,979,048 වන වායු සමීකරණ යන්ත්‍ර බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය (Centre for External Degrees and Professional Learning) සඳහා මිල දී ගනු ලැබිණි. කෙසේ වුවද, ක්‍රමක්ෂය ගණනය කිරීමකින් තොරව, එම වත්කම් හි පිරිවැය අදායමක් ලෙස ගණනය කර ඇති බව සමාලෝචනය කිරීමේ දී සොයා ගනු ලැබිණි. එම හේතුව නිසා, රු. 3,683,966 ක් වන හිඟය ගිණුම් වාර්තා තුල අවතක්සේරු කර ඇත.

(d) මන්ත්‍රණ/ පාලක සභාවේ නියමයන් පරිදි, අමතර ජීව කාලය වසර 02 සිට 05 දක්වා කාලයක් සඳහා පිරිවැය රු. 57,004,044 වන සම්පූර්ණයෙන්ම ක්ෂය වීමට ලක් වූ කාර්යයාල උපකරණ හා ක්‍රීඩා උපකරණ රු. 20,637,790 අගයයක් සඳහා නැවත අගය කිරීම 2020 වර්ෂයේ ජූලි මස 01 වන දින සිදු කරනු ලැබිණි. කෙසේ වුව ද, නැවත අගය කල ස්ථාවර වත්කම් හි ක්ෂය ගණනය කිරීමේ දී සිදු වූ ගණිතමය දෝෂයක් හේතුවෙන්, ක්ෂය කල ප්‍රමාණය රු. 3,310,493 කින් අවතක්සේරු කර ඇති බව සමාලෝචනය කිරීමේ දී අනාවරණය විය. එමනිසා, වාර්ෂික ගිණුම් වාර්තා තුල වන හිඟය, එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී ඇත.

(e) පිරිවැය රු. 23,055,912 වන අයිමැක් පරිගණක (iMac Computers) 44ක්, AHEAD ව්‍යාපෘතිය තුලින් 2018 වර්ෂයේ ප්‍රසම්පාදනය කර ඇති අතර එම අයිතමයන් විශ්වවිද්‍යාලයීය වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගෙන නොමැත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව මා විසින් විගණන කටයුතු සිදු කරනු ලැබීය. මූල්‍ය කටයුතු වෙනුවෙන් ප්‍රමිතීන් ප්‍රකාරව මාගේ විගණන වගකීම, මාගේ වාර්තාවේ විගණකාධිපතිගේ යන පරිච්ඡේදයේ පැහැදිලි කර ඇත. තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත යන බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ සඳහන් අනෙකුත් තොරතුරු.

2020 වර්ෂයේ වාර්ෂික වාර්තාවෙ හි සඳහන් තොරතුරු අනෙකුත් තොරතුරු තුල අන්තර් ගත කොට ඇත. එහෙත් එහි, විගණන වාර්තාවට ප්‍රථම මා විසින් ලබා ගත් ගිණුම් වාර්තා සහ මාගේ විගණන මතය සහිත වාර්තාවන් ඉදිරිපත් කර නොමැත. කළමනාකරණය විසින් අනෙකුත් තොරතුරු සම්බන්ධව වගකීම දැරිය යුතු වේ.

ගිණුම් වාර්තා පිළිබඳ ව වන මාගේ විගණන මතය තුලින් අනෙකුත් තොරතුරු සම්බන්ධ මතයන් ආවරණය නොවන අතර ඒ සම්බන්දව කිසිදු ප්‍රකාශිත සහතිකයක් ලබා දෙනු නොලැබේ.

ගිණුම් වාර්තා සමඟ මාගේ විගණනයන් පිළිබඳ ව මාගේ වගකීම වනුයේ, ඉහත හඳුනා ගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ සිදු කිරීමේ දී මාගේ විගණන කටයුතු සම්බන්ධ ව ලබා ගත් දැනුම මත අනෙකුත් තොරතුරු ගිණුම් ප්‍රකාශණ සමඟ ප්‍රමාණාත්මක නොවන විට දී හෝ නොඑසේ නම් ප්‍රමාණාත්මක ලෙස වැරදි අයුරින් ප්‍රකාශ කර ඇත්නම් පමණි.

මෙම විගණන වාර්තාව ලබා ගැනීමට ප්‍රථම මා විසින් මෙහි අනෙකුත් තොරතුරු යන පරිච්ඡේදය පරිශීලනය කල විට හා මෙම අනෙකුත් තොරතුරු තුල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ අන්තර්ගත වන්නේ නම්, ඒ බව මා විසින් මෙහි සඳහන් කරනු ලබන අතර එලෙස සඳහන් කල යුතු වේ. මෙහිදී, මා හට මේ සම්බන්ධව කිසිවක් වාර්තා කිරීමට නොමැත.

1.4 මූල්‍ය ප්‍රකාශණ සඳහා කළමනාකරණයේ සහ රාජ්‍යය පාලන අධිකාරියේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සත්‍ය හා සාධාරණ මතයක් ඉදිරිපත්වන අයුරින්, මූල්‍ය ප්‍රකාශණ පිළියල කිරීම කළමණාකරණයේ වගකීම් වන අතර, වංචා හා වැරදි හේතුවෙන්

ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ද කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේ දී විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම්, හෙළි දරව් කිරීම්, උචිත තත්ත්වයන්, අඛණ්ඩ පැවැත්ම සඳහා බලපාන තත්ත්වයන් සහ ගිණුම්කරණ කටයුතු අඛණ්ඩ පැවැත්ම මත පදනම් ව සිදුකිරීම ආදිය තහවුරු කර ගැනීම කළමනාකරණයේ වගකීම වේ. එනම්, කළමණාකරනයේ අභිමතය විශ්වවිද්‍යාලයේ කටයුතු ඈවර කිරීම හෝ විශ්වවිද්‍යාල කටයුතු නවතාලීම නොවන්නේ නම්, මීට පරිබාහිරව කිසිදු තාත්ත්වික විකල්පයක් නොමැති අතර එය එලෙස සිදු කළ යුතු වේ.

මූල්‍ය ප්‍රකාශණ වාර්තාකරණය පිළිබඳ ව රාජ්‍යය පාලන අධිකාරියෙහි වගකීමට යටත් වේ. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) පරිච්ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳව නිසියාකාරව වාර්තාවන් පොත් තැබීම සිදුකළ යුතු අතර මෙමඟින් විශ්වවිද්‍යාලයේ වාර්ෂික හා ආවර්තිත මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම සඳහා උපකාරී වේ.

1.5 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම උදෙසා විගණකවරුන්ගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්, එනම් වැරදි හා වංචාවලින් තොර ද යන්න මත විගණන මතයන් විගණන වාර්තාව තුලින් එළි දැක්වීම හා එමඟින් සාධාරණ සහතික වීමක් ලබාදීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීමක් යන්න ඉතා උසස් සහතික වීමක් වන නමුත්, එමඟින් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන් පවතින සෑම විටම විගණනයන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ප්‍රකාරව සිදු කළ ද, එම සාවද්‍ය ප්‍රකාශණ අනාවරණය කර ඇති බව සහතික නොකෙරේ. සාවද්‍ය ප්‍රකාශයන් වැරදි හා වංචා මත පැන නැගිය හැකිවන අතර, ඒවා ප්‍රමාණාත්මක ද යන්න තීරණය වනුයේ, පෞද්ගලික හෝ සමස්තයක් වශයෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පරිහරණය තුලින්, මූල්‍ය ප්‍රකාශන භාවිතයට ගනු ලබන්නන් විසින් ඔවුන්ගේ ආර්ථික තීරණයන් කෙරෙහි මෙමඟින් බලපෑම් කර ඇති තත්ත්වයන් තුලය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ප්‍රකාරව, මාගේ විගණනය, වෘත්තීය විනිශ්චයභාවයක් සහ වෘත්තීය සංදේහවාදයකින් යුක්තව ක්‍රියාත්මක කිරිමට කටයුතු කෙරුණි. මා විසින් තව ද:

- වැරදි හා වංචා හේතුවෙන් මූල්‍ය ප්‍රකාශයන් හී ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් පැවතීමේ අවදානම හඳුනා ගැනිම සහ තක්සේරු කිරිම සිදු කරන අතර එමඟින් විගණන සැලැස්ම,

සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ. මේ සඳහා මාගේ විගණන මතය ඉදිරිපත් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදු කෙරේ. වංචා හේතුවෙන් පැන නැඟුන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්, වැරදි හේතුවෙන් පැන නැඟුන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්, අනාවරණය නොවීමට වඩා අනාවරණය නොවීමේ අවදානම වැඩිය. මන්ද කුමන්ත්‍රනයන්, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා අත් හැරීම, වරදවා විස්තර කිරීම, අභ්‍යන්තර පාලනයන් ප්‍රතික්ෂේප කිරීම ආදිය වංචාවන් මඟින් සිදුවේ.

- අවස්ථාවන් වෙනුවෙන් සිදුකරන විගණනයන් උචිත ව සිදුකිරීම සඳහා වන විගණන සැලැස්ම නිර්මාණය කර ගැනීම සඳහා අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් පිළිබඳව අවධානය යොමු කිරීම. එහෙත් මෙමඟින් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයන්ගේ කාර්යසාධනය පිළිබිඹු කරන මතයන් ඉදිරිපත් කිරීම අරමුණු නොකෙරේ.

- කළමනාකරණය විසින් භාවිතා කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හී උචිත බව, ගිණුම්කරණ ඇස්තමේන්තුන් හී සාධාරණ බව හා අදාල හෙළිදරව් කිරීම් පිළිබඳව ඇගයීමට ලක් කිරීම.
- විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පවත්වා ගෙන යාම උදෙසා බලපෑම් කරනු ලබන සිදුවීම් හා තත්ත්වයන් මඟින් ප්‍රමාණාත්මක අවදානමක් ඇතිවන්නේ ද යන්න, ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම හා ලබා ගත් විගණන සාක්ෂි මත මෙන්ම කළමනාකරණයේ භාවිතයේ උචිත බව මත තීරණය කිරීම. මා විසින් ප්‍රමාණාත්මක අවධානමක් පවතින්නේ යැයි හඳුනා ගත් විට හා එය මාගේ විගණන මතය වෙනස් කිරීමට තරම් ප්‍රමාණවත් නොවන්නේ නම්, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශණ මත පදනම් ව විගණන වාර්තාවේ හෙළි දරව් කිරීම සඳහා මා විසින් අවධානය යොමු කළ යුතු වේ. විගණන වාර්තාව නිකුත් කරනු ලබන දින දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත මාගේ නිගමනය ලබා දී ඇත. කෙසේ වුව ද, අනාගතයේ සිදුවන සිදුවීම් හා තත්ත්වයන් මඟින් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම යන්නට බලපෑම් එල්ල වීමේ හැකියාවක් පවතී.
- මූල්‍ය ප්‍රකාශණයන් ඉදිරිපත් කිරීම සඳහා පාදක වූ ගණුදෙණු හා සිද්ධීන් අපක්ෂපාති ලෙස ඉදිරිපත් කර ඇත් ද යන්න සහ මූල්‍ය ප්‍රකාශණයන් හී මුළු ඉදිරිපත් කිරීම, අන්තර්ගතය, සැකැස්ම, හෙළි දරව් කිරීම ආදිය ඇගයීමට ලක් කිරීම.

මාගේ විගණනය සිදු කල කාල පරාසය තුල, සුවිශේෂී විගණන හඳුනා ගැනීම, අභ්‍යන්තර පාලනයන්ගේ දුර්වලතා හා අනෙකුත් ගැටලු කළමණාකරනය සමඟ සන්නිවේදනය කරනු ලැබීය.

2. අනෙකුත් නීතීමය හා රෙගුලාසිමය වශයෙන් අවශ්‍ය වාර්තාවන්

2.1 **පහත අවශ්‍යතාවයන් සඳහා වන නියත විධිවිධාන 2018 අංක 19 දරණ විගණන පනතේ ඇතුළත් වේ.**

2.1.1 තත්ත්වාගණනය කළ විගණන මතයට පරිබාහිරව අනෙකුත් කරුණු සඳහා බලපාන තත්ත්වයන් විස්තර කර ඇති පරිච්ඡේදයේ, මාගේ පරීක්ෂණය අනුව විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු හා පැහැදිලි කර ගැනීම් මා විසින් ලබාගත් අතරම, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(a) පරිච්ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් උචිත ගිණුම්කරණ වර්තාවන් පවත්වාගෙන යනු ලැබේ.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (d) (iii) වන පරිච්ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශණයන් පෙර වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇත.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (d) (iv) වන පරිච්ඡේදය ප්‍රකාරව, මා විසින් පෙර වර්ෂය සඳහා නිර්දේශ කළ නිර්දේශනයන් සහිතව මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කර ඇත. (පරිච්ඡේද 1.2 (a) හැර)

2.2 ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් කෙරෙහි අනුගමනය කළ ක්‍රියාපටිපාටි සහ ලබා ගත් සාක්ෂි ප්‍රමාණවත් නොවුන බැවින් කිසිවක් මාගේ අවධාණයට පාත්‍ර නොවීය;

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (d) ප්‍රකාරව සිදුකරන ලද ක්‍රියාකාරකම්වලට පරිබාහිරව විශ්වවිද්‍යාලය විසින් එළඹෙන්නා වූ ගිවිසුම් පිළිබඳව, විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩල සාමාජිකයකුගේ සෘජු හෝ වක්‍රව ඒ පිළිබඳව උනන්දුවක් දැක්වීම පිළිබඳව කරුණු ගෙන හැර දැක්වීම;

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (f) ඡේදයට අමතරව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් අදාල ලිඛිත නීතීන්, සාමාන්‍ය හා විශේෂ උපදේශනයන් සම්බන්ධයෙන් කටයුතු නොකර ඇති තත්ත්වයන් ගෙන හැර දැක්වීම;

නිතිරීති/ නියමයන්වලට අදාල යොමුව		**සටහන**
(a)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන සංග්‍රහය සහ උසස් අධ්‍යාපන ආයතනය	
(i)	1971 අංක 38 දරණ මුල්‍ය පනතේ 02 (XV) වන	2020 වර්ෂයේ දී ස්ථාවර තැන්පතුන් හි තැන්පත් කර ඇති රු. 31,559,910 ක අයෝජන මුදල

	පරිච්ඡේදයේ VII වන ඡේදය සහ 11 වන පරිච්ඡේදය හා 2003 ජුනි 02 දිනැති පොදු ව්‍යවසායන් සම්බන්ධ චක්‍රලේඛ අංක PED /12 හි පරිච්ඡේද 8.2.2.	තැන්පත් කිරීමට ප්‍රථම මුදල් අමාත්‍යාංශයෙන්, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සහ විශ්වවිද්‍යාලයීය මූල්‍ය කමිටුන් හී පූර්ව අනුමැතිය හා එකඟතාවය ලබා නොතිබීම.
(ii)	2017 ජූලි 10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන චක්‍රලේඛ අංක 10/2017 සහ XX වන පරිච්චේදයේ 3(1) වන කොටස	කාර්යය මණ්ඩලයේ සියළු දෙනාගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයක සටහන් විය යුතුය. එසේ වුවද අධ්‍යයන කාර්යය මණ්ඩලය අදාළ නීතියට අනුව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කර තිබූ අතර ඔවුන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් සතුටුදායක පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (g) ඡේදය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය විසින් එහි බලතල, කාර්යයන් සහ සිදු කළයුතු කර්තවයන් සිදු කිරීමට අපොහොසත් වී ඇති බව පෙන්නුම් කළ යුතුය;

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (h) ඡේදය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය විසින් එහි සම්පත් ප්‍රසම්පාදනය සහ භාවිතා කිරීමේ දී ඒවා ආර්ථිකමය, කාර්යක්ෂමතාවයක් සහ සඵලදායකත්වයකින් යුක්තව අදාල කාලසීමාව තුල දී අදාල නීතීමය තත්ත්වයන් තුල කටයුතු නොකිරීම දක්නට ලැබේ;

2.3 අනෙකුත් විගණන නිර්දේශ

(a) ආපදා ණය, උත්සව දීමනා, ලැබිය යුතු වැටුප්, බැඳුම්කර උල්ලංඝනයන් සහ කොන්ත්‍රාත්කරුවන් සහ ආයතන මඟින් ලැබිය යුතු මුළු අගය වන රු. 9,719,274 ක මුදල අවුරුදු 01 සිට අවුරුදු 19ක දක්වා වූ කාල පරාසයක් තුල අය කරවා ගැනීමකින් තොරව 2020 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන තෙක් ද, අයවිය යුතු අගයක් ලෙස පවතී.

(b) කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු රු. 12,834,860 ක රඳවා ගත් මුදල් වසර 02 සිට වසර 07ක් දක්වා වූ කාල රාමුවක් තුල පියවා දැමීමට කටයුතු කර නොමැති හෙයින් එම අගයයන් 2020 දෙසැම්බර් මස 31 වන දින දක්වා ද පෙන්නුම් කෙරේ. මෙහි දී, එම මුදල් අදාල පිරිස් වෙත පියවා දැමීමට හෝ විශ්ව විද්‍යාලය ලද ආදායමක් ලෙස හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොමැත.

(c) පිරිවැය රුපියල් මිලියන 93.5 වන රසායනාගාර උපකරණ 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාල සීමාව තුල ප්‍රසම්පාදනය කටයුතු සිදුකර ඇතිමුත්, එම උපකරණ වසර 01 සිට වසර 04ක කාල පරාසයක් තුල අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතයට නොගෙන නිෂ්ක්‍රීය ව පවත්වා ගෙන ගොස් ඇත. තව ද, පිරිවැය රු. 461,577 වන වායු සමීකරණ යන්ත්‍ර 02, පරිගණක මේස 20ක් සහ ඉලෙක්ට්‍රොනික තිර (electronic screen) සහ බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය (Center for External Degrees and Professional Learning) හි ස්ථාපිත දේශන ශාලා 02ක් වසර 5ක කාලයක සිට අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතයට නොගෙන නිශ්ක්‍රීය ලෙස 2013 සිට 2016 දක්වා වූ කාල පරාසය තුල පවත්වා ගෙන ගොස් ඇත.

(d) 2016 වර්ෂයේ නොවැම්බර් 25 වන දින රු. 11,647,200 ක පිරිවැය සහිත සීඑන්සී යන්ත්‍ර ඊඩීඑම් සොලිඩ් (CNC Machine EDM Solid) මිල දී ගැනීම සඳහා අදාල සැපයුම්කරු වෙත ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. කෙසේ වුව ද, සැපයුම්කරු විසින් ටෙන්ඩරය ප්‍රදානය කිරීම ප්‍රමාද වීම සහ මිල ගණන් හී උච්චාරනය හේතුවෙන් අදාල ටෙන්ඩරය පිළිබඳ ඉදිරි කටයුතු සිදුකර නොමැත. පසු ව, 2019 වර්ෂයේ දී නැවත ලංසු කැඳවීම් සිදු කර ඇති අතර රු. 21,104,229 ක මුදලකට වෙනත් සැපයුම්කරුවකුගෙන් එම උපකරණ ප්‍රසම්පාදනය කර ගැනීමට කටයුතු කර ඇත. මෙම හේතුව නිසා, විශ්ව විද්‍යාලය විසින් පළමු ලංසුව හා සැසඳීමේ දී අතිරේකව රු. 9,457,029 ක මුදලක් දැරීමට සිදු වී ඇත.

(e) ව්‍යවහාරික විද්‍යා පීඨය වෙනුවෙන් වන රසායනාගාර කටයුතු ආරම්භ කිරීම 2011 වසරේ ඔක්තෝම්බර් මස 31 වන දින ආරම්භ කර ඇති අතර එහි වැඩ කටයුතු 2014 පෙබරවාරි මස 15 වන දින නිම කර ඇති අතර ඒ සඳහා රු. 84,156,395ක පිරිවැයක් දරා ඇත. තව ද, 2016 වසරේ දී විදුයුත් මෙවලම් සවිකිරීම උදෙසා රු. 1,856,467 ක මුදලක් වැය කර ඇත. කෙසේ වුව ද එම රසායනාගාර ගොඩනැගිල්ල අදාල රසායනාගාර උපකරණ ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් සහ රසායනාගරයට අවශ්‍ය ජලාපවහන, අපදව්‍ය සහ ගෑස් සැපයුම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් අදාල අපේක්ෂිත අරමුණ වෙනුවෙන් වසර 06ක කාලයක් භාවිතයට ගෙන නොමැත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

22. විගණකාධිපතිගේ වාර්තාව සඳහා නිරීක්ෂණ

SEUSL/VC/AR/2020/02

04.08.2021

විගණකාධිපති ,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

2018 අංක 19 **දරණ ජාතික විගණන පනතේ** 12 **වන ඡේදය ප්‍රකාරව** 2020 **දෙසැම්බර් මස** 31 **දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන මත විගණකාධිපති වාර්තාව.**

2020 ජූලි මස 20 දිනැති ඉහත වාර්තාව සඳහා අප පහත සඳහන් නිරීක්ෂණ ලබා දෙන්නෙමු.

1. මූල්‍ය ප්‍රකාශණ

1.1 විගණන මතය

1.2 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

(a) 2020 වර්ෂය සඳහා ගොඩනැගිලි, කාර්යාල උපකරණ සහ ක්‍රීඩා උපකරණ නැවත අගය කිරීම සිදුකල අතර ඒවා 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ තුල අන්තර් ගත කරනු ලැබීය.
සාමාන්‍ය පරිපාලන අංශය මගින් විගණන විමසුමෙ හි සඳහන් අනිකුත් අයිතමයන් නැවත අගය කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

(b) ප්‍රමුඛත්වය පදනම් කරගෙන සියලුම ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලබන්නේ රාජ්‍ය භාණ්ඩාගාරය මඟින් ලබා දෙන අරමුදල්හි හිඟ භාවය හේතුවෙනි. ඒ අනුව, විගණන විමසුමෙහි සඳහන් විද්‍යාගාර උපකරණ ප්‍රසම්පාදනයන් ද, ප්‍රසම්පාදනය කර ඇත්තේ එහි අදාල පරිශීලක දෙපාර්තමේන්තුවෙහි අවශ්‍යතාව හා වුවමනාව අනුව වන අතර හා එම උපකරණයන් භාරදීමේන් හා සවි කිරීමෙන් පසු නිසි ලෙස භාවිතයට ගනු ලැබේ යන උපකල්පනය මත වේ. තව ද, මෙහි වගකීම් කාලය ආරම්භ වනුයේ, සැපයුම්කරු විසින් උපකරණයන් භාර දීමෙන් පසුය. තවද, මෙහි වගකීම් කාලය ආරම්භ වනුයේ, සැපයුම්කරු විසින් උපකරණයන් භාරදෙනු ලබන දිනයේ සිටය.

උපකරණයන් ප්‍රසම්පාදනයේ දී යොදා ගනු ලබන සාමන්‍ය භාවිතයක් ලෙස මෙම අයිතමයන් ද අනෙකුත් යන්ත්‍ර සමඟ භාවිතා කිරීම සඳහා සවිකිරීම් සිදු කරනු ලැබූ අතර, ඒ අනුව ක්ෂය වීම් අගය කරනු ලැබීය.

මිල දී ගත් උපකරණ, සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණයන් කිරීමේ දී භාවිතා කිරීමේ වගකීම අදාල පරිශීලක දෙපාර්තමේන්තුවේ, අංශ ප්‍රධානියාගේ සහ අදාල පීඨයේ පියාධිපතිවරයා සතු වේ. අදාල උපකරණ නිසි ලෙස භාවිතයට නොගන්නේ නම් එය අදාල පීඨයෙහි පියාධිපතිවරයාගේ අකාර්යක්ෂමතාවය පිළිබිඹු කරයි.

(c) 2016 වර්ෂයේ මාර්තු මස 01 දිනැති කොමිසන් සභා චක්‍රලේඛ අංක 04/2016 හි 5.5.2 පරිච්ඡේදය ප්‍රකාරව භාවිතයට ගත් අගයය (ක්‍රමක්ෂය අගය නොමැතිව), සංවර්ධන අරමුදලෙන් (අදාල වැය ශීර්ෂය) අඩුකර එය විලම්භීත ආදායම් ගිණුම වෙත බැර කළ යුතුය.

කෙසේ වුවද, විගණන විමසුමෙ හි යෝජනා කර ඇති පරිදි, ප්‍රාග්ධන වැය අගයයන් විනිදුවා හැරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම සහ භාවිතයට ගත් අගයය වත්කමේ ජීව කාලය තුල ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කිරීම මඟින් මුල්‍ය ප්‍රකාශණ වඩාත් හොඳින් ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කිරීම.

(d) විශ්වවිද්‍යාලය මඟින් එහි ඇති වත්කම් නැවත අගය කිරීමේ කාර්යය පළමු වතාවට සිදුකරනු ලැබිණි. එම ක්‍රියාදාමයෙහි දී, විගණන විමසුමෙහි සඳහන් කාර්යාල උපකරණ සහ ක්‍රීඩා අයිතමයන් නැවත අගය කිරීමේ කටයුත්ත ප්‍රථම වතාවට 2020 වර්ෂයේ දී සිදු කරනු ලැබීය.

ඒ අනුව එම වර්ෂයේ දී, පැකේජයෙහි අන්තර්ගත ස්ථාවර වත්කම් ලේඛනයෙහි අගයයන්, නැවත අගය කල අගයයන් වෙත යාවත්කාලීන කරනු ලැබුණි. කෙසේ වුවද, මෘදුකාංග සැපයුම්කරුවන්ගේ කේතීකරණයන්ගේ වැරදීමක් හේතුවෙන්, එහි ගණනය කිරීමේ දෝෂයක් හට ගැනුනු අතර එමඟින්, එම නැවත අගය කළ වත්කම් හි ක්ෂය වීම් ගණනය කිරීමේ දී දෝෂයන් සිදුවිය. එමනිසා, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණයන් තුලින් මෙම රු.මි. 3.3ක වෙනස නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(e) ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයෙ හි මෙහෙයුම් තාක්ෂණික කාර්යාංශය (Operational Technical Secretariat- OTS) විසින් AHEAD ව්‍යාපෘතියට අදාල

ගිණුම් වාර්තා වෙන් වෙන් වශයෙන් පවත්වා ගෙන යාම සහ එම වාර්තාවන් කොළඹ පිහිටි මෙහෙයුම් හා අධීක්ෂණ සහය කණ්ඩායම (Operations and Monitoring Support Team -OMST) වෙත යවනු ලැබේ. කෙසේ වුව ද, අදාල දත්තයන් මෙහෙයුම් හා තාක්ෂණික කාර්යාංශය (OTS) මඟින් ලැබීමෙන් පසු, විගණන විමසුමෙහි සඳහන් අයුරින් වාර්ෂික පදනම මත මෙම අගයයන් ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

1.3 විශ්වවිද්‍යාලයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව තුල අන්තර් ගත අනෙකුත් තොරතුරු.

1.4 මූල්‍ය ප්‍රකාශණ සම්බන්දයෙන් කළමනාකරණයේ සහ රාජ්‍යය පාලන අධිකාරියේ වගකීම

1.5 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම උදෙසා විගණකවරුන්ගේ වගකීම

2. අනෙකුත් නිතීමය හා රෙගුලාසිමය වශයෙන් අවශ්‍ය වාර්තාවන්

2.1
2.2.2

(i). 2020 වර්ෂයේ දී, ඉපයූ මූල්‍ය අගයයන් සහ බැඳුම්කර උල්ලංඝනයෙන් ලද අගයයන් පමණක් ස්ථාවර තැන්පත් හී තැන්පත් කිරීමට කටයුතු කෙරිණි.
කෙසේ වුව ද, විගණන විමසුමෙහි සඳහන් අයුරින් සහ චක්‍ර ලේඛ ප්‍රකාරව ස්ථාවර තැන්පතූන් හී තැන්පත් කිරීමට පෙර මුදල් අමාත්‍යාංශයෙන්, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් (Line Ministry), විශ්වවිද්‍යාල පාලක සභාව සහ මූල්‍ය කමිටුව මඟින් අදාල එකඟතාවයන් සහ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.

(ii). ශ්‍රී ලංකාවේ පවතින විශ්වවිද්‍යාල පද්ධතියේ හි පොදු සම්මතයක් ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් නොකෙරේ. මෙම ගැටලුව සෑම විගණන වාර්තාවකම ඇතුළත් වුව ද, මේ සඳහා නව ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට වෑයම් කිරීම හේතුවෙන් විවිධ වූ ගැටලුවලට මුහුණ දීමට විශ්වවිද්‍යාල පද්ධතියට සිදු වී ඇත.

2.3 අනෙකුත් විගණන නිර්දේශ

(a)

නම/විස්තරය	**මුදල**	තත්ත්වය
<u>ආපදා ණය</u>		
ඒ. ආර්. එම්.	29,058.00	ණය මුදල් අයකරවා ගැනීම සම්බන්ධව ඒ. ආර්. එම්.

ඉමිතියාස්		ඉමිතියාස්ට එරෙහිව නිතිමය පියවර ගෙන ඇත.
ඒ. එම්. ශේහාම්	49,984.00	හිඟ මුදල් අය කර ගැනීම සම්බන්දයෙන් පියවර ගෙන ඇත.
<u>උත්සව දීමනා</u>		
ආර්. ජේයකාන්තන්	10,000.00	හිඟ මුදල් අය කර ගැනීම සම්බන්දයෙන් පියවර ගෙන ඇත.
ලැබිය යුතු වැටුප්	1,874,776.00	හිඟ මුදල් අය කර ගැනීම සම්බන්දයෙන් පියවර ගෙන ඇත (සේවකයින් 8 දෙනෙකුගේ)
කොන්ත්‍රාත්කරුවන් සහ ආයතන	242,990.00	හිඟ මුදල් අය කර ගැනීම සම්බන්දයෙන් පියවර ගෙන ඇත.
<u>බැදුම්කර උල්ලංඝනය</u>		
ඒ. ආර්. එම්. ඉමිතියාස්	1,043,137.22	බැදුම්කර උල්ලංඝනය මත ලැබිය යුතු මුදල් සහ අනෙකුත් හිඟ හිටි මුදල් අයකරවා ගැනීම සම්බන්ධව ඒ. ආර්. එම්. ඉමිතියාස්ට එරෙහිව නිතිමය පියවර ගෙන ඇත.
එම්.එම්.එම්. මාහීර්	345082.21	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල මඟින් අයකරවා ගැනීමට පියවර ගෙන ඇත.
ඒ. ආර්. එස් ජෙස්මි	6,124,246.24	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් ඒ. ආර්. එස් ජෙස්මි සමග සන්නිවේදනයන් සිදු කල අතර එම බැදුම්කර උල්ලංඝනයෙන් අයවිය යුතු මුදල අයකරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
මුළු එකතුව	**9,719,274.00**	

(b) අදාල බලධාරීන්ගේ අනුමැතිය මත, එම රැඳවුම් මුදල් පියවා දැමීමට හෝ වසර දෙකකට අධික කාලයක් පවතින හිමිකම් නොපෑ අගයයන් විශ්වවිද්‍යාලීය ආදායම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කිරීම.

(c) මිල දී ගත් උපකරණ බහුතරයක් අදාල අරමුණු වෙනුවෙන් භාවිතයට ගනු ලැබිණි. අලුතින් ඉදිකල පීඨයක් ලෙස අදාල දෙපාර්තමේන්තුව විසින් එම උපකරණයක් ආරක්ෂිතව තැබීමට අවශ්‍ය ඉඩ ප්‍රමාණයන් අවස්ථානුකූලව සහ හදිසි තත්ත්වයන් මත එකවරම ලබා ගැනීමට කටයුතු කෙරිණි.අදාල ඉඩ ප්‍රමාණයන් පුළුල් කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන මුල්‍යයන්ගේ හිඟ බව හේතුවෙන්, සමහරක් වූ උපකරණයන් භාවිතයට ගැනීම ප්‍රමාද විය.

(d)

- ජාතික ලංසු කැඳවීමේ ක්‍රමය (National Competitive Bidding method) මත මුලු අපේක්ෂිත මිල රු.මි. 45ක් වටිනා මෙන්ම ආවරණ අගයක් ලෙස රු. 900,000 ක ආරක්ෂිත ලංසුවක් ඉල්ලුම් කරමින් සහ ලංසුවෙහි වලංගු කාල සීමාව 2016 වර්ෂයේ නොවැම්බර් 01 දිනය දක්වා දක්වමින් පහත සඳහන් අයිතමයන් මිල දී ගැනුණි. තොරතුරු පහත පරිදි වේ.

අංකය	අයිතමයේ නම	අපේක්ෂිත මිල රු. (මි.)	අපේක්ෂිත අගය මත ආරක්ෂිත ලංසුවෙහි අගය (2%)	ලැබූ සත්‍ය ආරක්ෂිත ලංසුවෙහි අගය (VAT රහිතව)	ලද සත්‍ය ලංසු අගය මත ආරක්ෂිත ලංසු අගය	ප්‍රදානය කරනු ලැබුවේ
01.	CNC Vertical Milling Machine	12	240,000	12,333,000	246,660	Samson Engineer's (PVT) Ltd.
02.	CNC turning Centre	10	200,000	11,225,000	224,500	Samson Engineer's (PVT) Ltd.
03.	CNC Machine EDM Solid	10	200,000	10,128,000	202,560	CMC Engineering Expert GMBH
04.	CNC Machine Wire Cut EDM	13	260,000	11,054,000	221,080	API Traders (PVT) Ltd.
	මුලු අගය	45	900,000	44,740,000	894,800	

- ඒ අනුව, ඉහත සඳහන් අයිතම 04 වෙනුවෙන් සැපයුම්කරුවන් 08 දෙනෙකුගෙන් ලංසූන් ලද අතර, එම ලද ලංසූන් 08.07.2016 දින විවෘත කරනු ලැබීය.
- තාක්ෂණික ඇගයුම් කමිටු (TEC) , දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC) රැස්වීම් පැවැත්වීම අභ්‍යන්තර ක්‍රියාවලීන්ගේ ප්‍රමාදයන් පැවතීම හේතුවෙන් (මෙම තාක්ෂණික ඇගයුම් කමිටු සමාජිකයන් ස්ථාපිත විශ්වවිද්‍යාලයන් හි විශේෂඥයින් වේ) අප විසින් සියලු

සැපයුම්කරුවන්ගෙන් 2016.10.26 වන දින ආරක්ෂිත ලංසුන්ගේ වලංගු කාලය 2016.11.30 දින දක්වා දිර්ඝ කරන ලෙස ඉල්ලීම් කල අතර එම කාල සීමාව තුල අප විසින් TEC සහ DPC කමිටු රැස්වීම් පිළිවෙලින් 2016.11.18 දින සහ 2016.11.24 දිනයන්හි දී පැවැත් වූ අතර, ඉහත වගුවෙහි සඳහන් අයුරින් තෝරා ගනු ලැබූ සැපයුම්කරුවන් තිදෙනෙකු සඳහා ප්‍රදානය කිරීමේ ලිපිය 2016.11.25 දින ප්‍රදානය කෙරිණි.

- කෙසේ වුවද, **සීඑම්සී ඉංජීනියරින් එක්ස්පර්ට් ජීඑම්බීඑච් (CMC Engineering Expert GmbH)** සැපයුම්කරු විසින් ලංසුව සඳහා වන වලංගු කාලය දිර්ඝ කිරීමට අදාල ලිපි ඉදිරිපත් කර නොමැති අතර ඒ වෙනුවට, ඔවුන් විසින් වෙනත් ලිපියක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ ඔවුන්ට මෙම ටෙන්ඩරය ක්‍රියාත්මක කිරීමට නොහැකි බවත් ඒ සඳහා හේතුව ලෙස දක්වා ඇත්තේ, ඔවුන්ගේ සැපයුම්කරුවන් විසින් මිල ගණන් ඉහල නංවා ඇති බවත්ය.
- පසුව, සීඑම්සී ඉංජීනියරින් එක්ස්පර්ට් ජීඑම්බීඑච් සැපයුම්කරුගේ ලිපිය මත පදනම් ව, අප විසින් **TEC** කමිටු රැස්වීමක් සංවිධානය කල අතර මෙම ගැටලුව සම්බන්දව එහි සාකච්ඡා වූ සහ එහි නිර්දේශ මත **TEC** කමිටුව විසින් ඊ ලඟට සිටින ලංසුකරු වෙත ලංසුව ප්‍රදානය කිරීමට අනුමැතිය ලබා දුනි. කෙසේ වුවද, මෙම අවස්ථාවේ දී වූ අරමුදල් හිඟකම සහ අදාල ලංසුවෙහි වලංගු කාල සීමාව ඉක්මවා ගොස් ඇති බැවින්, මෙම ප්‍රසම්පාදනය තවදුරටත් ක්‍රියාත්මක නොවුණි.
- සීඑන්සී මැෂින් ඊඩීඑම් සොලිඩ් **(CNC machine EDM Solid)** සැපයුම්කරුට අදාල රු.202,560 වන ලංසු බැදුම්කරය සහ සීඑම්සී ඉංජීනියරින් එක්ස්පර්ට් ජීඑම්බීඑච් **(CMC Engineering Expert GmbH)** සැපයුම්කරුට අදාල රු.10,128,000 බැදුම්කරයන්ගේ වලංගු කාල සීමාව ඉක්මවා ගොස් තිබූ බැවින් සහ ලංසු බැදුම්කරයන්ගේ කාලය දිර්ඝ නොකිරීම හේතුවෙන් මෙම ලංසු බැදුම්කර ආපසු අයකරවා ගැනීම සඳහා අවශ්‍ය කාලසීමාවක් නොපැවතිණි.

2016 වර්ෂයේ ඔක්තෝම්බර් මස 31 වන දින ඉහත සඳහන් බැදුම්කරයන්ගේ වලංගු කාලය අවසන්ව තිබූ හෙයින්, එම බැදුම්කරයන් සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට නොහැකි විය. එබැවින්, නව බැදුම්කරයන් සඳහා ආරාධනා කිරීම 2018 වර්ෂයේ ජුනි 20 වන දින ජාතික ලංසු කැඳවීමේ ක්‍රමය මත සිදු

කෙරිණි. මෙමඟින් තරඟකාරුවන් සඳහා ප්‍රමාණවත් අවස්ථාවන් ජනිත විය. ප්‍රධාන වශයෙන් මිල ගණන්හි පවතින වෙනස්කම් සඳහා හේතු වී ඇත්තේ, මුල් රට/ හඳුන්වා දුන් රට හා නිෂ්පාදිත රට (country of origin and the country of manufacture) නිසාවෙනි. මිල දී ගත් යන්ත්‍රය යුරෝපීය නිෂ්පාදිතයක් වන අතර පෙර සලකා බැලූ යන්ත්‍රයෙහි මුල් රට සහ නිෂ්පාදිත රට වනුයේ තායිවානයයි. සාමාන්‍යයෙන්, මෙවැනි සමාන පිරිවිතර සහිත යුරෝපීය නිෂ්පාදිතයන්ගේ ක්‍රියාකාරීත්වය තායිවානය, ආසියාතික සහ චීනයේ නිෂ්පාදිත නිෂ්පාදනයන්ට වඩා ඉහළ වේ. ඊට අමතරව, එම වසර 02ක කාල සීමාව තුල දී, උද්දමනය හා මිල ගණන් හි විචල්‍යයන්, මිල ගණන් සඳහා බලපෑම් කර ඇත.

(e) ජලාපවහන, අපදව්‍ය සහ ගෑස් සැපයුම් කටයුතු සිදු කරමින් පවතින අතර මෙය 2021 වර්ෂයේ දෙසැම්බර් මස මැද භාගය තුල දී අවසන් කිරීමට අපේක්ෂිතය.

මහාචාර්ය එම්. එම්. එම්. නාජීම්
උප කුලපති
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

පිටපත: සහකාර අභ්‍යන්තර විගණක

.